වාර්ෂික වාර්තාව '07

සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම

ජනතාව විසින් ජනතාව උදෙසා...

අපගේ දර්ශනය

තම ගනුදෙනුකරුවන්ගේ ආන්තික අවශ්‍යතාවන් සඳහා ඔවුන් සමග එක්සත්ව ක්‍රියා කරන ආයතනයක්වීම

අපගේ මෙහෙවර

ඉතා ඉහළ ආචාරාත්මක හා සදාචාරාත්මක ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි සකස් කළ නිර්මාණාත්මක වූද, සියලුදෙනාට දැරිය හැකි වූද, රක්ෂණ විසඳුම් මගින් අපගේ අනුග්‍රාහකයන්ගේ අවශ්‍යතා සිහියේ තබා ගැනීම තුළ "සත්‍ය වූ ආරක්ෂාව"ප්‍රශස්ත ලෙස ලබාදීම

පටුන

මූල්‍ය ප්‍රකාශන උද්ධෘත 01
සභාපතිතුමාගේ පණිවිඩය 02
කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය 04
සමාජමය වගකීම් වාර්තාව 08
අධ්‍යක්ෂ මණ්ඩලය 10
කළමනාකරණ කණ්ඩායම 12
අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව 13
ජීවගතකඥ වාර්තාව 15
අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය 16

මූල්‍ය සටහන්

විගණන වාර්තාව 18
ශේෂ පත්‍රය 19
ආදායම් ප්‍රකාශනය 20
අයිතිකාර ප්‍රාග්ධනයේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 21
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 22
ආදායම් ප්‍රකාශන - ආංශික සමාලෝචනය 2007 23
ආදායම් ප්‍රකාශන - ආංශික සමාලෝචනය 2006 24
ගිණුම්කරණ ප්‍රතිපත්ති 25
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 31
අතිරේක තොරතුරු - දිගුකාලීන රක්ෂණය - ශේෂ පත්‍රය 41
අතිරේක තොරතුරු - දිගුකාලීන රක්ෂණය - ආදායම් ප්‍රකාශනය ... 42
අතිරේක තොරතුරු - මුදල් ප්‍රවාහ ප්‍රකාශය 43
අතිරේක තොරතුරු සඳහා සටහන් 44
සමාගම් තොරතුරු ..... ඇතුල් පසු කවරය

මූල්‍ය ප්‍රකාශන උද්ධෘත

සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම
වාර්ෂික වාර්තාව 2007

	2007	2006	වෙනස %
දළ ලිඛිත වාරික මුලු වටිනාකම (රු. 000)	361,243	265,591	36
මූලික වත්කම් (රු. 000)	574,527	413,765	39
ශුද්ධ වත්කම් (රු. 000)	197,248	128,737	53
බදු ගෙවීමට පෙර ලාභය (රු. 000)	31,195	12,602	148
බදු ගෙවීමෙන් පසු ලාභය (රු. 000)	22,856	8,284	176
කොටසකට ඉපැයීම් අගය (රු.)	1.78	0.78	128
ජීවිත රක්ෂණ අරමුදල (රු. 000)	165,103	127,435	30
කාරක ප්‍රාග්ධනයට ඉපැයීම (%)	1.19	1.21	(1)



මුළු ආදායම් වර්ධනය

රු. මිලියන 361.2



මුළු වත්කම් වර්ධනය

රු. මිලියන 574.5



බදු ගෙවීමට පෙර ලාභයේ වර්ධනය

රු. මිලියන 31.2



කොටසකට ඉපැයීම් වර්ධනය

රු. 1.78



ශුද්ධ වත්කම් වර්ධනය

රු. මිලියන 197.2



ජීවිත රක්ෂණ අරමුදලේ වර්ධනය

රු. මිලියන 165.1

"ඉතිහාසයේ ප්‍රථම වරට සමස්ථ වාර්ෂික ඉලක්කය සම්පූර්ණ කිරීම සහ 2006 වසරට සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ අංශයේ ලාභය 100% කින් වැඩිවීම සතුටට කරුණකි. එමෙන්ම මෙම කාර්ය සඳහා දායක වූ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ප්‍රණාමය පළ කරමි"

සමුපකාර රක්ෂණ සමාගමේ නව පස් අවුරුදු සැලැස්මේ ප්‍රථම වර්ෂය ලෙස 2007 වර්ෂය එළඹිණි. ඒ අනුව ඉලක්ක කරා ගමන් ගත් සමාගම ඉතිහාසයේ ප්‍රථම වරට සමස්ථ වාර්ෂික ඉලක්කය සම්පූර්ණ කිරීම සහ 2006 වසරට සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ අංශයේ ලාභය 100% කින් වැඩිවීම සතුටට කරුණකි. එමෙන්ම මෙම කාර්ය සඳහා දායක වූ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ප්‍රණාමය පළ කරමි.

තවද 2007 වසරේ උපයාගත් ලාභය පදනම් කර සමාගමේ කොටස්කරුවන් සඳහා 17% ක ලාභාංශයන් ගෙවීම සඳහා යෝජනා කිරීමට අදහස් කර ඇත. එමෙන්ම අපගේ ජීවිත රක්ෂණ ඔප්පු හිමියන් සඳහාද පෙර වසර පරිදි ප්‍රසාද දීමනාවක් ලබාදීමේ හැකියාවද ඇත.

නව රක්ෂණ අණ පනත් අනුව 2007 වසර අවසානයේදී සමාගමේ ව්‍යවස්ථාපිත කාරක ප්‍රාග්ධනය රුපියල් මිලියන 200 දක්වා වැඩි කිරීම අභියෝගයක් ලෙස සැලකුවත් ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති හා සංගම්වල මූල්‍ය ශක්තියෙන් එම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගනු ලැබූ අතර ඒ සඳහා සහයෝගය ලබාදුන් සියලු දෙනා හට ප්‍රණාමය පළ කරමි.

සමුපකාර සංවිධානවල මූල්‍ය ශක්තියෙන් පිහිටුවනු ලැබූ අප සමාගම සමුපකාර සේවා ජාලය වඩාත් පුළුල් කිරීම සඳහා 2006 වසර අවසානයේදී සමුපකාර සමිතිවලට අනුබද්ධව රක්ෂණ සේවා කාර්යාල පිහිටුවීම ආරම්භ කළ අතර 2007 වසර අවසානයේදී සේවා කාර්යාල 28 දක්වා වැඩි කරන ලදී. එමගින් සමුපකාර සමිතියක ප්‍රධාන ආදායම් අංශ ලෙස සැලකූ පාරිභෝගික හා ග්‍රාමීය බැංකු අංශයට අමතරව රක්ෂණ සේවා අංශයක් ලෙස ක්‍රියාත්මක කරන අතර ආරම්භයේ සිටම ලාභදායීව පවත්වාගෙන යාමට හැකිවීම රක්ෂණ සේවා කාර්යාලවල විශේෂතාවය වේ. මේ තත්ත්වය මත සමුපකාර රක්ෂණ සේවා කාර්යාල පිළිබඳ සමිති අතර විශේෂ උනන්දුවක් ඇති වී ඇති අතර සමුපකාර සාමාජික රක්ෂණ අවශ්‍යතා උපරිම අයුරින් ආවරණය කෙරේ තවද 2011 වසර අවසාන වන විට රක්ෂණ සේවා කාර්යාල 200 ක් පිහිටුවීම අපගේ බලාපොරොත්තුව වේ. 2008 වර්ෂය තුළ අපි වඩාත් පුළුල් සේවා ඒකක ආරම්භ කිරීම හා නව රක්ෂණ ආවරණ බිහි කිරීමට අපේක්ෂා කරමු. එමගින් 2008 වර්ෂය තවදුරටත් සාර්ථක වර්ෂයක් වනවා නොඅනුමානය.

තවද වර්ෂය තුළ සමුපකාර සමිති, පුද්ගලික ව්‍යාපාර, රජයේ ව්‍යාපාර හා ඒකපුද්ගල ග්‍රාහක සංඛ්‍යාවද වර්ධනය වී ඇති අතර ඔවුන් සමාගම කෙරෙහි දැක් වූ අනුග්‍රහය ඉමහත් ලෙස අගය කරමි.

සමුපකාර රක්ෂණ සමාගම වෙත නිරන්තර සහයෝගය දැක්වූ මධ්‍යම ආණ්ඩුවේ සමුපකාර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමන්ලා සහ කාර්ය මණ්ඩලවලට හා පළාත් සමුපකාර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමන්ලා හා කාර්ය මණ්ඩලවලටත් සමුපකාර දෙපාර්තමේන්තුව සහ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමන් ඇතුලු කාර්ය මණ්ඩලවලටත් අපගේ ස්තුතිය පිරිනැමේ. එමෙන්ම අපගේ අධ්‍යක්ෂතුමන්ලා හා කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් සමාගම ඉහළ තත්ත්වයකට ගෙන ඒමට දරණ ප්‍රයත්නයද අගය කළ යුතුය.

පී.ඊ. මැතිව් සමාගම විසින් විගණන කටයුතු ඉතා කාර්යක්ෂම අන්දමින් කරන ලද අතර ව්‍යාපාර කළමනාකරණ උපදේශක සමාගම ලේකම්වරුන් හැටියටත් සමාගම නව සමාගම් පනත යටතේ කටයුතු කිරීමට මග පෙන්වීම පිළිබඳවත් එසේම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා මහ සභා රැස්වීම් මෙහෙයවීමට උපදෙස්දීම පිළිබඳවත් ස්තුති කරමි.

2008 ලැබුවා වූ නව වසර සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

ඩබ්. ලලිත් ඒ. පීරිස්
සභාපති

"2007 වර්ෂයේදී විකුණුම් හා අලෙවි කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිශෝධනය කරන ලදී. එම කාර්ය මණ්ඩලයට ස්ථිර ගිවිසුම්ගත කොමිස් මුදල් පදනම් වූ හා ක්ෂෙත්‍ර නිලධාරී තනතුරු අතර තෝරා ගැනීම්වලට නම්‍ය ලෙස ඉඩකඩ සලසන ලදී"

"2007 වර්ෂයේදී විකුණුම් හා අලෙවි කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිශෝධනය කරන ලදී. එම කාර්ය මණ්ඩලයට ස්ථිර ගිවිසුම්ගත කොමිස් මුදල් පදනම් වූ හා ක්ෂෙත්‍ර නිලධාරී තනතුරු අතර තෝරා ගැනීම්වලට නම්‍ය ලෙස ඉඩකඩ සලසන ලදී".

ව්‍යාපාරික ප්‍රතිඵල

2007 වර්ෂයේදී සමාගම දෙවැනි පස් අවුරුදු චක්‍රයට අවතීර්ණ විය. වර්ෂය තුළදී සැලසුම් කරන ලද රුපියල් මිලියන 390 ඉලක්කය මුලුමනින්ම සපුරාලීමට වර්ෂය අවසානය වන විට හැකි වූ බව මෙහි සඳහන් කරන්නේ සතුටිනි.

2007 වර්ෂය තුළදී රක්ෂණ ක්ෂෙත්‍රයේ සාමාන්‍ය වර්ධන වේගයට වඩා වැඩි වේගයක් පවත්වා ගැනීමට සමාගමට හැකි වී ඇත.

	සමාගමේ වර්ධන වේගය %	රක්ෂණ ක්ෂෙත්‍රයේ වර්ධන වේගය %
ජීවිත රක්ෂණය	36	21
සාමාන්‍ය රක්ෂණය	40	23

2006 වර්ෂයේදී සමාගමේ සමස්ථ වර්ධන වේගය 17.19% ක් වූ අතර මෙම වර්ෂය තුළදී එය 36% ක් විය.

2007 වර්ෂය තුළදී සමාගම පටන් ගත් දින සිට වැඩිම ලාභයක් ලබා ගැනීමට සමත් වී තිබේ.

	2007 රු. මිලියන	2006 රු. මිලියන
සාමාන්‍ය රක්ෂණය	29.62	12.60
ජීවිත රක්ෂණය	37.99	35.22

2007 වර්ෂය අවසානයට සමාගම විසින් 17% ක ලාභාංශයක් කොටස්කරුවන්ට ලබාදීමට හැකි වී ඇත.

2006 වර්ෂයේදී රුපියල් 0.78 ක් වූ කොටසක ඉපැයූ අගය 2007 දී රුපියල් 1.78 ක් දක්වා වැඩිවිය. මෙය මුලු කාලය තුළ වැඩිම අගය විය.

2006 දී රුපියල් මිලියන 127 ක් වූ ජීවිත රක්ෂණ අරමුදල 2007 වසර අවසානයේදී රුපියල් මිලියන 165 ක් දක්වා වැඩි විය. 2006 වසරේදී 36% ක් වූ එහි වර්ධනය 2007 වසරේදී 30% ක් දක්වා අඩු වී ඇත.

සාමාන්‍ය රක්ෂණ වර්ගවල ආදායම විශ්ලේෂණය කරන විට ගිනි රක්ෂණ අංශයේ වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි. එහෙත් මෝටර් වාහන රක්ෂණය විශාලම දායකත්වයක් තවම ලබා දෙයි.

සේවා ජාලයේ වර්ධනය

සමාලෝචනයට භාජනය වූ කාලය ඇතුළත සමාගම විසින් තම භෞමික ජාලය සීඝ්‍රයෙන් පුළුල් කර තිබේ. සමාගමේ ප්‍රධාන වෙළඳපලවල් වන්නේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ නිසා මෙය ඉමහත්සේ වැදගත් සංවර්ධනයකි.

2006 දී 30 ක් ව පැවති ශාඛා ජාලය 2007 දී 35 ක් දක්වා වැඩි විය. සමාගමේ සේවා අංශය පුළුල් කිරීම සඳහා විවිධ වර්ගවල සමුපකාර සමිති ගණනාවක් සමග වර්ෂය තුළ කටයුතු කර ඇත. ඒ අනුව සමුපකාර සමිතිවල රක්ෂණ සේවා ඒකක සංඛ්‍යාව 2006 අවසානයට තිබුණේ 3 ක් වුවත් එය 2007 දී 24 දක්වා වැඩි කරන ලදී. මෙම බොහෝ ඒකක පිහිටුවන ලද්දේ ග්‍රාමීය ප්‍රදේශවල වන අතර ඉන් සමාගමේ සේවාවන් කාර්යක්ෂම කිරීම අපේක්ෂා කරන ලදී. මේවායේ මග පෙන්වීම පුහුණුව හා සේවා කාර්ය මණ්ඩල අධීක්ෂණය සමාගමේ ශාඛා ජාලය හරහා ඉෂ්ට විය.

මෙම වර්ෂය තුළ ඇති කරන ලද නවත් සේවාවක් වූයේ පැය 24 පුරා සේවා සපයන ඇමතුම් මධ්‍යස්ථානයයි. මෙයින් ඉතා ඉක්මන් පාරිභෝගික සේවාවක් හා ඉක්මන් වන්දි හිමිකම් ගෙවීමක් කිරීමට උපකාරී වීමක් කෙරේ. එසේම සමාගම සහතික කරන ලද නවත් කරුණක් වූයේ රක්ෂිතයාට ඉතා සාධාරණ අයුරින් අනතුරු තක්සේරු කිරීම හා ඉක්මන් වන්දි හිමිකම් ගෙවීමය.

	2007 රු. මිලියන	2006 රු. මිලියන	වර්ධන වේගය %	රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධන වේගය %
මෝටර් වාහන	191.6	113.8	67.97	18.10
ගිනි	30.7	23.7	30.20	13.25
මුහුදු	6.5	6.8	- 5.97	1.85
විවිධ	60.9	63.5	- 1.09	12.76

2006 වර්ෂයේ වත්කම් ශේෂය වූ රුපියල් මිලියන 419.76, 2007 වර්ෂයේදී රුපියල් මිලියන 574.52 දක්වා වැඩි විය. වත්කම් වගකීම් අනුපාතය 2007 වර්ෂයේදී 1.5:1.0 වශයෙන් වූ ස්ථාවර තත්ත්වයක් පෙන්නුම් කරයි.

මෙම වර්ෂය තුල හඳුන්වා දෙන ලද, ක්ෂණික වාහන රක්ෂණ ක්‍රමය, පිළිබඳව වූ ජනප්‍රිය බව 2007 වර්ෂය තුළ අනපේක්ෂිත පරිදි වාහන රක්ෂණ ව්‍යාපාර දියුණුවට හේතුවක් විය.

සමාගමේ ජංගම ප්‍රචාරක සේවාව විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශ වල ඉතා ජනප්‍රිය විය. මෙම ඒකකය විසින් ජනතාවට රක්ෂණය ජනප්‍රිය කිරීම පමණක් නොව අධ්‍යාපනය ලබා දීම සඳහා ද වීදි දර්ශණ හා දේශන ආදිය සංවිධානය කර ඇත.

මානව සම්පත් සංවර්ධනය

2007 වර්ෂය තුළ විකුණුම් හා අලෙවිය

2007 වර්ෂයේදී විකුණුම් හා අලෙවි කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිශෝධනය කරන ලදී. එම කාර්ය මණ්ඩලයට ස්ථිර ගිවිසුම්ගත කොමිස් මුදල් පදනම් වූ හා ක්ෂේත්‍ර නිලධාරී තනතුරු අතර තෝරා ගැනීම්වලට නම්‍ය ලෙස ඉඩකඩ සලසන ලදී.

වර්ෂය ආරම්භයේ දී පැවති 163 ක් වූ සේවක සංඛ්‍යාව වර්ෂය අවසාන වන විට 225 ක් දක්වා වර්ධනය විය. එසේම අලෙවි කාර්ය මණ්ඩලයද 390 සිට 710 දක්වා වැඩි විය.

සමාගම කාර්ය මණ්ඩලය විවිධ මට්ටම්වල කාර්ය මණ්ඩල පුහුණුව සඳහා සහයෝගය ලබා දෙයි. මේ වර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් හතක් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පුහුණුව හදාරා තිබේ. තිදෙනෙක් ඉන්දියාවේ රක්ෂණ ආවසරික සහතික පත්‍ර විභාගයේ අන්තර් මධ්‍යම මට්ටම සමත් වූහ. මේ වර්ෂය තුළ එක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණියක් එක්සත් රාජ්‍යධානියේ රක්ෂණ ආයතනයේ ආවසරික සාමාජිකත්වය ලැබීම විශේෂ ජයග්‍රහණයකි. මෙහෙයුම් මට්ටමේ කාර්ය මණ්ඩලයේ පුහුණු ක්‍රම වඩා ක්‍රමවත් කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගන්නා ලදී.

මේ වර්ෂයේ සිට රක්ෂණ මණ්ඩල රක්ෂණ නියෝජිත බලපත්‍රය සඳහා අවශ්‍ය විභාග පුහුණුව පමණක් නොව සමස්ථ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා යන සියලුම වියදම් දැරීමට ප්‍රතිපත්තියක් වශයෙන් කටයුතු කර තිබේ. මේ කාලය තුළ රක්ෂණ ක්ෂේත්‍ර නිලධාරීන් 65 ක් විභාගය සමත්ව රක්ෂණ බලපත්‍රය ලබා ගෙන ඇත. හැකියාවන් පුහුණු විධායකයෙකු පූර්ණ කාලීනව නොසිටි අවධියක ලබා ගැනීම විශේෂත්වයකි. මීට අතිරේකව වෙනත් ආයතන මගින් සංවිධානය කරන ලද රක්ෂණ සහතික පත්‍ර විභාග ද කාර්ය මණ්ඩල අතර ජනප්‍රිය විය.

ඉතා ඉහළ කාර්ය සන්ධානයක් ඇති අලෙවි කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මාසිකව හා වාර්ෂිකව මුදල්මය තිලිණ හා සහතික පත්‍ර ලබා දීම නොකඩවා කරගෙන යන ලදී.

විකුණුම් පරිසරය

රට තුළ රක්ෂණය ජනතාව අතරට ගොස් ඇත්තේ 10% ටත් අඩුවෙන් වුවද රක්ෂණ සමාගම් අතර වෙළඳ තරගය පෙරට වඩා වැඩියෙන් දියුණුව පැවතින. මෙම තත්ත්වයට මුහුණදීම සඳහා විශේෂ වෙළඳ උපාය මාර්ග හඳුන්වාදීම අත්‍යවශ්‍ය වූ කරුණක් විය.

2007 වර්ෂය තුළ වැඩි වූ උද්දමන තත්ත්වය රක්ෂණ ව්‍යාපාරයට සැලකිය යුතු අන්දමින් බලපෑමක් කර තිබේ.

රක්ෂණ වෙළඳපලේ යායුතු දුර බොහෝ වුවත් සමාගම හා සමග විශේෂයෙන් කටයුතු කරන අඩු ආදායම් ලාභී ජනතාවගේ මිලට ගැනීමේ ශක්තිය තවදුරටත් පිරිහීම සමාගමට විශාල අභියෝගයක් වනු ඇත.

ඉදිරි වර්ෂය පිළිබඳ කැපවීම

සංයුක්ත රක්ෂණ ක්‍රමය වෙනස් කොට ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය වෙන්කර වෙනම සමාගම් පිහිටුවීම සඳහා වූ යෝජිත නීති සංවිධානය සහ ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 දක්වා වැඩි කිරීමේ යෝජනාව ඉමහත් වෙනස්කම් අපේක්ෂා කෙරේ. මෙවැනි තත්ත්වයක් මත සමාගමට ප්‍රාග්ධනය වැඩි කිරීමට සාපේක්ෂව ව්‍යාපාරික පරිමාවද වැඩි කිරීමට සිදුවන අතර ඉතා කාර්යක්ෂම ප්‍රාග්ධන කළමනාකරණයක් තුළින් ඉහළම මූල්‍ය ඵලදායිතාවක් ඇති කර ගැනීමට සිදුවනු ඇත. 2007 වර්ෂය තුළ සමාගම විසින් හඳුන්වා දෙන ලද වරණීය කොටස් නිකුතුවද මේ සඳහා දැඩි බලපෑමක් ඇති කරයි.

වැඩිවන ජීවන වියදම සලකා බලා 2008 වර්ෂයේදී කාර්ය මණ්ඩල වැටුප් 40% කින් වැඩි කිරීමට සමාගම තීරණයක් ගත්තේය. මෙහෙයුම් පිරිවැය හා අනුපාත සලකා බැලීමේදී මේ ගැන විශේෂ අවධානයක් යොමු කිරීමට සිදුව තිබේ. එසේම සන්නිවේදන ගාස්තු වැනි කාර්යාල වියදම්ද ඉහළ යනු ඇත. සමාගමේ අභ්‍යන්තරිකව කටයුතු කරන සියලු දෙනාට මෙම වැඩිවන පිරිවැය සලකා බැලීමට හා වියදම් අඩුකිරීමට උත්සාහ ගත යුතුව තිබේ.

ස්තූතිය

සමාගමේ ව්‍යාපාර කටයුතුවලට වඩා තිරසාර භාවයක් ලඟා කර දීමට රුපියල් මිලියන 50ක් කොටස් ප්‍රාග්ධනය වශයෙන් ලබා දුන් සමුපකාර නායකයන්ට සමාගම වෙනුවෙන් ස්තූතිවන්ත වෙමි. මේ වර්ෂය තුළ ලබා ගත් දියුණුවට කැපකිරීම් කළ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ කෘතඥතාව හිමිවේ. එසේම 2007 වර්ෂය සඳහා අධිෂ්ඨානය කළ ඉලක්ක ලඟා කර ගැනීමට ඇප කැප වූ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය ඇතුළු සියලු කාර්ය මණ්ඩලයට විශේෂයෙන් කෘතඥ වෙමි.

රක්ෂණ මණ්ඩලයේ මග පෙන්වීම අපගේ ඉදිරි ගමනට සහාය වූ අතර, ඒ ගැන ස්තූතිය සමාගම වෙනුවෙන් පිරිනමමි. සමුපකාර හා සමුපකාර සංවර්ධනය පිළිබඳ ගරු ඇමතිතුමා පළාත් සභා ඇමතිතුමන්ලා, මධ්‍යම ආණ්ඩුවේ හා පළාත් සභාවල සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් හා කාර්ය මණ්ඩල වර්ෂය තුළ අප වෙත නොමඳ සහයෝගයක් ලබා දුන් අතර ඒ ගැන සමාගමේ කෘතඥතාවය පිරිනැමේ.

සමාගමේ විවිධ ව්‍යවස්ථාපිත කටයුතු වලට සහය වූ වරලත් ගණකාධිකාරීවරුන් වූ පී. ඊ. මැතිව් සමාගම සහ පීව ගණක කළමනාකරණ හා ව්‍යාපාර කළමනාකාර උපදේශක සමාගමට සහ පේ. බී. බෝඩා සමාගමටද අපගේ ස්තූතිය පිරිනැමේ.

ඔබ සැමගේ අඛණ්ඩ සහාය මත 2008 වර්ෂය නව ප්‍රගතියක් පිළිබඳව අධිෂ්ඨානයක් ඇති කර ගනිමි.

ඩබ්ලිව්. යූ. හේරත්
කළමනාකාර අධ්‍යක්ෂ

ජනතාව විසින් කරන ලද ප්‍රාග්ධන සම්පාදනය හේතු කොට ගෙන 'ජනතාව විසින් ජනතාව උදෙසා පිහිටුවන ලද සමාගමක් ' වශයෙන් සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම තම දායකයන් පිළිබඳව ඇති වගකීම හොඳින් තේරුම් ගෙන ඇත.

සමුපකාර ව්‍යවසායයන් විසින් අනුගමනය කළ යුතු ප්‍රධාන ප්‍රතිපත්ති වලින් එකක් ලෙස 'ප්‍රජාව කෙරෙහි සැළකිලිමත්වීම' සමුපකාරය පිළිබඳ අනන්‍යතා ප්‍රකාශයෙන් සඳහන් වේ. එය හුදෙක් ආධාර සැපයීම හෝ ප්‍රදානයන්ට සීමාවුවක් නොවේ. ඉන් සමාගම් ප්‍රතිපත්තිවලට තිරසාර භාවයේ ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ග අන්තර්ග්‍රහණය කිරීමද අපේක්ෂා කෙරේ. එමනිසා සමුපකාර රක්ෂණ සමාගමද මෙම ප්‍රතිපත්තිය පිළිගෙන තම ව්‍යාපාරික උපාය මාර්ගවලට එය අන්තර්ග්‍රහණය කර තිබේ.

සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම ඉහළ ආදායම් ලබන අයගේ පමණක් හොව මධ්‍යම හා අඩු ආදායම් ලබන ගනුදෙනුකරුවන්ගේ රක්ෂණ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වමින් ක්‍රියා කර ඇත. එසේම ගනුදෙනුකරුවන්ගේ ආදායම් මට්ටම්වලට සරිලන පරිදි රක්ෂණ ආවරණ තෝරා ගැනීමට උදව්වීම සඳහා විකුණුම් කාර්ය මණ්ඩලය පුහුණු කර තිබේ.

අඩු ආදායම් ලබන සාධාරණ කණ්ඩායම් සහ ප්‍රජා සංවිධානවල අවශ්‍යතා අනුව සකස් කරන ලද රක්ෂණ ආවරණ රැසක් අප විසින් හඳුන්වාදී තිබේ. මේවායින් අඩු වාරික මුදලකට ඉහළ වන්දි හිමිකම් ලබාදීමේ හැකියාව ඇති කර තිබේ. සමගි ජීවිත රක්ෂණ ආවරණය රක්ෂණ වෙළඳපලේ අඩුම මාසික වාරිකය වූ රුපියල් 150/- තරම් අඩු වාරිකයකින් ලබා ගැනීමේ හැකියාව සපයා දී තිබේ. එසේම සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම විසින් සමුපකාර සේවකයන්, සාමාජිකයන් හා සාධාරණ කණ්ඩායම් සඳහා විශ්‍රාම රක්ෂණ ආවරණද සකස් කර ඇත. මෙවැනි සාමාන්‍ය ප්‍රජාව තුළ පවතින කණ්ඩායම්වලට කරන සේවය හිසා සමාගම ප්‍රකට වෙමින් පවතී.

2007 වර්ෂය තුළදී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ගනදෙනුකරුවන් සඳහා වඩාත් පහසු අන්දමින් සේවාවන් ලබාදීමට පරිශ්‍රමයක් දරා තිබේ. මේ අනුව 2006 දී පැවති සේවා මධ්‍යස්ථාන තුන 2007 අවසන් වන විට විසිහතර දක්වා වර්ධනය විය. මේ මධ්‍යස්ථාන සාමාන්‍ය ජනතාව අතර බහුලව ජනප්‍රිය වෙමින් පවතී. 2011 අවසන් වන විට මෙවැනි සේවා මධ්‍යස්ථාන 200 පිහිටුවීමට සමාගම අපේක්ෂා කරයි.

සමාජීය වශයෙන් හා පරිසරාත්මක ලෙස විනාශකාරී වූ කර්මාන්ත පාරිභෝගික සේවා සපයන සමාගම් හා සෙසු සමාගම්වලට සේවා සැපයීම සමාගම විසින් නොකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබේ. පරිසරය සුරැකීමේ ව්‍යාපාර වලට සමාගම අනුග්‍රහය දක්වා ඇති අතර මහජනයා ගැවසෙන තැන්වල පිරිසිදු බව රැකීමේ මාධ්‍ය කටයුතුවලටද අනුග්‍රහය දක්වා තිබේ.

සමාගම විසින් රජයේ මහමාර්ග ආරක්ෂා කිරීමේ අරමුදලට රුපියල් 223,000/- ක මුදලක් වර්ෂය තුළ ලබාදී තිබේ. 2007 වර්ෂය තුළදී සමාගම විසින් සමුපකාර සංවිධාන හා වෙනත් ප්‍රජා සංවිධාන විසින් සංවිධානය කරන ලද සංස්කෘතික හා සමාජමය උත්සව සඳහා ආධාර දී තිබේ. එසේම අනාගත ආයෝජනයක් වශයෙන් රක්ෂණයෙහි ඇති වටිනාකම දෙමාපියන් හා දරුවන් අතර අවබෝධ කරලීම පිණිස පෙර පාසල්, ළදරු පාසල් හා වෙනත් විද්‍යායතන විසින් සංවිධානය කරන ලද කටයුතු රැසකට සහභාගි වී ඇත. ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර සමාජ විද්‍යාවක් ලෙස රක්ෂණය හා අවදානම් කළමනාකරණය පිළිබඳ අවධානයක් ලබා ගැනීමට රජයේ පාසල් රැසක දේශන අප විකුණුම් කාර්ය මණ්ඩලය විසින් පවත්වා තිබේ.

රජයේ පාසල් වලින් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය හෝ උසස් පෙළ සමත්ව නවතින තරුණ තරුණියන් රක්ෂණ සේවා සපයන වෘත්තිකයන් කිරීම සඳහා වූ දිවයින පුරා පිහිටුවන ව්‍යාපාරයක් සමාගම විසින් 2007 වර්ෂය තුළ දියුණු කරන ලදී.

ඉන්පසුව ඔවුන් සමාගම තුළට අන්තර්ග්‍රහණය කිරීමටද කටයුතු කර තිබේ. මෙවැනි අලුතින් බඳවා ගන්නා රක්ෂණ වෘත්තිකයන්ගේ දෙමාපියන්ට කරුණු පැහැදිලි කිරීම සඳහා මව්පිය දිනයක්ද ඇතැම් ශාඛාවලින් සංවිධානය කර තිබිණ. මෙයින් රක්ෂණ වෘත්තිය පිළිබඳ සුභවාදී ආකල්ප ඔවුන් තුළ ඇති කිරීමට හැකියාව ලැබී තිබේ.

2007 වර්ෂය තුළ විශේෂයෙන් වාහන රක්ෂණය පිළිබඳව ඉහළම වර්ධන වේගයක් පවත්වාගෙන ගොස් තිබේ. මෙය ලඟා කර ගන්නා ලද්දේ තියුණු තරගයක් මැදය. පැය 24 ඇමතුම් මධ්‍යස්ථානය ආරම්භ කර වන්දි හිමිකම් ඉල්ලීම් ගැන කටයුතු කිරීම ඉක්මන් කිරීමෙන් වන්දි හිමිකම් පිළිබඳ ඉක්මන් හා නියම ප්‍රමිතීන් පවත්වා ගැනීමට හැකි විය.

වර්ෂය තුළදී අන්‍යෝන්‍යාධාරය තුළින් ආරක්ෂාව යන තේමාව මුල් කොට ගෙන හවක ඡායාරූප ශිල්පීන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ඡායාරූප හා චිත්‍ර ප්‍රදර්ශන පැවැත්වීමෙන් අනතුරුව ජයග්‍රාහකයන්ට මුදල් හා සහතික ප්‍රදානය කිරීමෙන් රක්ෂණය පිළිබඳ හැඟීම් වර්ධනයට ක්‍රියාකර තිබේ. මිනිස් සමාජය හා ජෛව විවිධත්වයේ පැවැත්මට ඇති බාධක හා තර්ජන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම තම යුතුකමක් ලෙස සමාගම සළකයි. එකිනෙකා ආරක්ෂාව සලසා ගැනීමට එකමුතු වන අතර ප්‍රජාවට තිරසාර ජීවනයක් ලබාදීමට උදව් කිරීම සඳහා ජනතාව අවධි කිරීම තම කාර්යක් ලෙස සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම හැමවිටම සළකයි.

ඩබ්. ලලිත් ඒ. පීරිස් මහතා

සීමාසහිත වෙන්නප්පුව විවිධ සේවා සමුපකාර සමිතියේ ගරු සභාපතිවරයා වන අතර සමුපකාර ලීසිං සමාගම සහ ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයේ ගරු අධ්‍යක්ෂවරයෙකු වේ.

උපාලි හේරත් මහතා

ශ්‍රී ලංකා පාරිපාලන සේවයේ හිටපු සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා ස්වීඩන් සමුපකාර සන්ධානයේ නේවාසික නියෝජිතවරයාද වේ.

පී.එම්.සී. බණ්ඩාර මහතා

සීමාසහිත මහියංගන විවිධ සේවා සමුපකාර සමිතිය, ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය සහ බදුල්ල දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයේ ගරු සභාපතිවරයා වන අතර ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය, ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය සහ සමුපකාර ලීසිං සමාගමේ උප සභාපතිවරයාද වේ.

එස්.ඒ. වික්‍රමපාල මහතා

වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ සහ සමුපකාර ලීසිං සමාගමේ ආරම්භයේ සිටම ගරු සභාපතිවරයා ලෙස කටයුතු කරයි. ඔහු සමුපකාර ග්‍රාමීය බැංකු මහ සංගමයේ ගරු සභාපතිවරයාද වේ.

බන්දු රණවක මහතා

ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය සීමාසහිත කොටපොල විවිධ සේවා සමුපකාර සමිතිය, මාතර දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය සහ මාතර දිස්ත්‍රික්කයේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ ගරු සභාපතිවරයාද වේ.

බී.බී. පුන්‍යදාස මහතා

මානව සංවර්ධන ණයදෙන හා සකසුරුවම් සමුපකාර සමිතියේ ගරු සභාපතිවරයා වන අතර ගම්පහ දිස්ත්‍රික්කයේ ණයදෙන හා සකසුරුවම් සමුපකාර සමිතියේ ගරු අධ්‍යක්ෂවරයෙකුද වේ.

ආරියපාල දහනායක මහතා

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සභාපතිවරයා වන අතර සීමාසහිත බෙලිඅත්ත විවිධ සේවා සමුපකාර සමිතියේ සහ හම්බන්තොට දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ ගරු සභාපතිවරයාද වේ.

ඩබ්.එච්. ජයසිරි මහතා

සීමාසහිත මහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ ගරු සභාපතිවරයා වන අතර ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයේ ගරු අධ්‍යක්ෂවරයෙකුද වේ.

ලයනල් සමරසිංහ මහතා

සමුපකාර රක්ෂණ සමාගමේ ආරම්භක සභාපතිවරයා වන අතර සමුපකාර ලීසිං සමාගමේ ගරු අධ්‍යක්ෂවරයෙකුද වේ.

ටී.එම්.එස්. නානායක්කාර මහතා

ජාතික රක්ෂණ සංස්ථාවේ හිටපු සභාපතිවරයෙකු වන අතර අධිනීතිඥවරයෙකුද වේ.

කේ. ලියනගේ මහතා

සීමාසහිත කොළොන්නාව විවිධ සේවා සමුපකාර සමිතිය, කොළඹ දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලය සහ ශ්‍රී ලංකා සමුපකාර ආරෝග්‍යශාලා සේවා සංගමයේ ගරු සභාපතිවරයා වන අතර ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය සහ සමුපකාර ලීසිං සමාගමේ ගරු අධ්‍යක්ෂවරයෙකුද වේ.

වී.එල්. වණිගසේකර මහතා

මධ්‍යම පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය සහ සීමාසහිත රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ගරු සභාපතිවරයා වන අතර සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමයේ අධ්‍යක්ෂවරයෙකි.

ඒ.එස්. සරත් මිල්ටන් මහතා

සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ ගරු සභාපතිවරයා වේ.

උපාලි හේරත් මහතා - *කළමනාකාර අධ්‍යක්ෂ*

කැළණිය විශ්වවිද්‍යාලයේ (ගෞරව) උපාධිධාරියෙකි. මානව සම්පත් සංවර්ධන ඩිප්ලෝමාධාරියෙකි (පූනේ). අසූසා පැසිෆික් (USA) විශ්වවිද්‍යාලයේ මානව සම්පත් නායකත්ව පුහුණුවක් ලබා ඇත. වසර 17 ක් ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල ඉහළ මට්ටමේ තරාතිරම්වල සේවය කර ඇත. ආසියා සහ පැසිෆික් කලාපවල පාරිභෝගික සමුපකාර කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන උපදේශකවරයෙකු ලෙස ජාත්‍යන්තර සමුපකාර සන්ධානයේ සේවය කර ඇත.

පී. තලගල මහතා - *සාමාන්‍යාධිකාරී*

වරලත් රක්ෂණ ආයතනයේ (UK) නිත්‍ය සාමාජිකවරයෙකි. රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 40 කට වඩා ජීවිත හා සාමාන්‍ය රක්ෂණ අංශවල පළපුරුද්දක් ඇත. එක්සත් රාජ්‍යධානියේ සහ ජපානයේ අවදානම් කළමනාකරණය සහ ප්‍රතිරක්ෂණ පුහුණුව ලබා ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර දේශකයෙකු වශයෙන්ද සේවය කරයි.

මොහාන් කරුණාරත්න මහතා - *සාමාන්‍යාධිකාරී(අලෙවි)*

ව්‍යාපාර පරිපාලනවේදියකු වන අතර වාණිජවේදී උපාධිධාරියෙකි. අලෙවිකරණ ඩිප්ලෝමා සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

අරුණ තෙබුවන මහතා - *මූල්‍ය කළමනාකරු*
ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික සාමාජික සහ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජික සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ගණකාධිකරණ) (ගෞරව) උපාධිධාරියෙකි.

චම්පිකා අල්විස් මෙනවිය - *සහකාර සාමාන්‍යාධිකාරී (ජීවිත රක්ෂණ)*
එක්සත් රාජ්‍යධානියේ වරලත් රක්ෂණ ආයතනයේ ආවසරික සාමාජික සහ කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිධාරිණී සහ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු ඩිප්ලෝමාධාරිණියක වේ.

ඩී.ජී. සූරියාරච්චි මහතා - *ජ්‍යෙෂ්ඨ කළමනාකරු (රථ වාහන රක්ෂණ)*
1970 වසරේ රක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධව වසර 38 ක පමණ මෝටර් රථ රක්ෂණ අංශයේ පළපුරුද්දක් ලබා ඇත.

ඩබ්.එච්. සෝමතිලක මහතා - *ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ගිනි හා විවිධ රක්ෂණ)*
රක්ෂණ ඩිප්ලෝමාධාරියෙකු වන අතර රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 35 කට වඩා පළපුරුද්දක් ඇත.

ඩී.ආර්.ආර්. දේවසුරේන්ද්‍ර මහතා - *ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුහුදු රක්ෂණ)*
1960 වසරේදී රක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධවී විවධ අංශවල සේවය කර ඇත.

ජේ.එස්. බණ්ඩාර මහත්මිය - *මානව සම්පත් කළමනාකාරිණී*
වරලත් වෘත්තීය මාර්ගෝපදේශක සහ පිරිස් කළමනාකරණ ආයතනයේ (ශ්‍රී ලංකා) සහ ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයේ සාමාජිකාවකි.

ලක්ෂමන් ප්‍රනාන්දු මහතා - *තොරතුරු හා තාක්ෂණ උපදේශක*
ශ්‍රී ලංකා පරිගණක සංගමයේ සම සාමාජිකයෙකු වන අතර රක්ෂණ ක්ෂේත්‍රයේ බැංකු සහ පරිගණක අංශයේ ආයතන 13 ක පමණ වසර 55 ක පළපුරුද්දක් ඇත.

සුචින්ත පෙරේරා මහතා - *කළමනාකරු (පරිගණක හා තොරතුරු)*
කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපති ව්‍යාපාර කළමනාකරණය හා විද්‍යාවේදී (ගෞරව) සහ මෙට්‍රොපොලිටන් ව්‍යාපාර පාසලේ ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාධාරියෙකි.

එම්. බඹරවානගේ මෙනවිය - *නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්*

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂකවරු සිය වාර්තාව මෙසේ ඉදිරිපත් කරති.

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

තවදුරටත් සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ ජීවිත හා සාමාන්‍ය රක්ෂණයයි. සමාගමේ ව්‍යාපාරික කටයුතුවල පරිමාව හා ප්‍රතිඵල පෙන්නුම් කරන දර්ශක කිහිපයක් පහත දැක්වේ:

දළ ලේඛනගත රක්ෂණ වාරික

	2007 රු.	2006 රු.
සාමාන්‍ය රක්ෂණ	289,691,043	207,492,855
ජීවිත රක්ෂණ	100,392,815	73,694,960

සමාලෝචනයට අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල

	2007 රු.	2006 රු.
වර්ෂය සඳහා ලාභය	31,195,490	12,602,383
අඩු කළා: ආදායම් බදු	(8,339,922)	4,318,736)
බදු ගෙවීමෙන් පසු වර්ෂයේ ලාභය	22,855,568	8,283,647
කොටසක ඉපැයීම	1.76	0.78

රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ

ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ 2007 දෙසැම්බර් 31 දිනට වූ රක්ෂණ ප්‍රතිපාදනය ඇක්චුවේරියල් හා මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්ගලික) සමාගම වෙනුවෙන් ජීවගණකඥ ආර්. කහකච්චි මහතා විසින් අගය කිරීමට ලක් කරන ලදී. උපදේශක ජීවගණකඥ තැනගේ වාර්තාවට අනුව රුපියල් 165,103,317/- ක් වූ මුදලෙහි රක්ෂණාවරණ හිමියන්ගේ ලාභාංශය සඳහා වූ වගකීමද අන්තර්ගත ය. උපදේශක ජීවගණකඥ තැනගේ මතය අනුව දිගුකාලීන රක්ෂණ සඳහා වන වගකීම් ආවරණය කර ගැනීමටද ප්‍රතිපාදනය ප්‍රමාණවත්ය.

ප්‍රසාද දීමනා

2007 වර්ෂය සඳහා සහභාගීත්ව ගිවිසුම් වෙනුවෙන් පහත සඳහන් පරිදි ප්‍රසාද දීමනා ප්‍රකාශ කර ඇති බව අධ්‍යක්ෂකවරු සතුටින් දන්වා සිටිති.

ඔප්පු වර්ගය	ප්‍රසාද දීමනාව	ඔප්පුව ආරම්භ කළ වර්ෂය
සමගි සිසු සෙත	රු. 1,000/- රක්ෂිත මුදල සඳහා රුපියල් 35/- බැගින්	2001 සහ ඊට පෙර
	රු. 1,000/- රක්ෂිත මුදල සඳහා රුපියල් 30/- බැගින්	2002
	රු. 1,000/- රක්ෂිත මුදල සඳහා රුපියල් 25/- බැගින්	2003
	රු. 1,000/- රක්ෂිත මුදල සඳහා රුපියල් 20/- බැගින්	2004
	රු. 1,000/- රක්ෂිත මුදල සඳහා රුපියල් 15/- බැගින්	2005
	රු. 1,000/- රක්ෂිත මුදල සඳහා රුපියල් 10/- බැගින්	2006

ලාභාංශ

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 17% ක පළමු හා අවසාන ලාභාංශයක් අධ්‍යක්ෂකවරු නිර්දේශ කරති.

ආයෝජන

සමාගම සතු ආයෝජන ගිණුම් සටහන් අංක 2 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

දේපල, පිරියත හා උපකරණ

වර්ෂය තුළදී දේපල, පිරියත හා උපකරණවල වූ වෙනස්වීම් ගිණුම් සටහන් අංක 3 හි දක්වා ඇත.

අධ්‍යක්ෂකවරු සහ ඔවුන් සතු කොටස් ප්‍රමාණය

2007 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂකවරු සහ ඔවුන් සතු කොටස් ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

අධ්‍යක්ෂකවරයාගේ නම	කොටස් ප්‍රමාණය
ඩබ්.එල්.ඒ. පීරිස් මහතා	3,032
පී.එම්.සී. බණ්ඩාර මහතා	5,757
ඩබ්.යූ. හේරත් මහතා	4,648
ලයනල් සමරසිංහ මහතා	3,227
වී.එල්. වණිගසිංහ මහතා	2,837
ඒ. දහනායක මහතා	2,837
ඩබ්.එච්. ජයසිරි මහතා	2,500
කේ. ලියනගේ මහතා	1,243
බී.බී. පුන්‍යදාස මහතා	1,171
එස්.ඒ. වික්‍රමපාල මහතා	124
බී. රණවක මහතා	-
ඒ.එස්. මිල්ටන් මහතා	-
ටී.එම්.එස්. නානායක්කාර මහතා	-

ප්‍රධාන කොටස් හිමියෝ

2007 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රධාන කොටස් හිමියන් සතු කොටස් ප්‍රමාණය පහත දැක්වේ:

නම	සාමාන්‍ය	වරණීය
සීමාසහිත මධ්‍යම පළාතේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	1,108,000	100,000
සීමාසහිත කොළඹ දිස්ත්‍රික්කයේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	1,000,000	114,750
සීමාසහිත වෙන්නනප්පුව විවිධ සේවා සමුපකාර සමිතිය	1,000,000	750,000
සීමාසහිත මාතර දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය	750,000	-
සීමාසහිත ඌව පළාතේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	621,500	-
සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	549,950	500,000
සීමාසහිත මාතර දිස්ත්‍රික්කයේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	549,950	-
සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය	554,000	67,500
සීමාසහිත අධ්‍යාපන සේවා සමුපකාර සකසුරුවම් හා ණය සමිති සංගමය	554,000	-
සීමාසහිත බෙලිඅත්ත විවිධ සේවා සමුපකාර සමිතිය	542,750	-
සීමාසහිත හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	540,500	-
සීමාසහිත කොළොන්නාව විවිධ සේවා සමුපකාර සමිතිය	533,750	-
සීමාසහිත හෝමාගම විවිධ සේවා සමුපකාර සමිතිය	533,750	-
සීමාසහිත පඬුවස්නුවර විවිධ සේවා සමුපකාර සමිතිය	500,000	
සීමාසහිත ගාල්ල දිස්ත්‍රික්කයේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	310,750	-
සීමාසහිත කලුතර දිස්ත්‍රික්කයේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය	310,750	-
සීමාසහිත තැපැල් හා විදුලි සංදේශ සේවකයින්ගේ සමුපකාර බැංකු සංගමය	310,750	-
සීමාසහිත නාත්තන්ඩිය විවිධ සේවා සමුපකාර සමිතිය	266,020	-
සීමාසහිත දිවුලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය	250,000	-
කොටස් එකතුව	10,786,420	1,532,250

සමාගමේ කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ බැඳීම මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 22 හි හෙළිදරව් කර ඇති බැඳීම් හැර සමාගම සමග වූ ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සෘජු හෝ වක්‍ර බැඳීමක් නැත.

විගණකවරු

වරලත් ගණකාධිකාරිවරුන් වන පී.ඊ. මැතිව් සහ සමාගම විසින් 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් විගණනය කර ඇති අතර විගණකවරුන් වශයෙන් තවදුරටත් ක්‍රියා කිරීමට ඔවුන් කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඔවුන් විගණකවරුන් ලෙස නැවත පත් කර ගැනීමත් ඔවුන්ගේ ගාස්තු තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂකවරුන්ට පැවරීමත් සඳහා වූ යෝජනාවක් වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

බිස්නස් මැනේජ්මන්ට් සර්විස් ලිමිටඩ්
ලේකම්

Actuarial & Management
Consultants (Pvt) Limited
1st Floor, 434, R.A. De Mel Mawatha, Colombo 03, Sri Lanka. Telephone: (94) 11 2575 280/(94) 11 4628557 Fax: (94) 11 4628557

2007 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරික කටයුතු පිළිබඳ ජීවගනකඥ තක්සේරුව

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය පාලනය කිරීමේ පනතේ 48 වගන්තිය යටතේ ලබා දෙන සහතිකය

සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම සඳහා පත් කරන ලද ජීවගනකඥ වූ ආර්. කහකච්චි වන මම මගේ දැනීමේ හැටියට පහත දැක්වෙන කරුණු සහතික කර ප්‍රකාශ කරමි.

1. 2007 දෙසැම්බර් මස 31 දිනට වූ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරික කටයුතු පිළිබඳ ජීවගනකඥ තක්සේරු කිරීම සඳහා සමාගම වගකීමට බාර දෙන්නා වූ හැම රක්ෂණ ආවරණයක් වෙනුවෙන් සමාගම විසින් ලබා දෙන ලද විස්තර මවිසින් ඇතුළත් කරන ලදී.
2. මා දෙන ලද උපදෙස් අනුව දත්තයන් පිළියෙල කර ඇති අතර වඩාත් පැහැදිලි කිරීම් අවශ්‍ය වූ ඒවා සම්බන්ධයෙන් මට සතුටුදායක පිළිතුරු ලැබී ඇත.
3. සමාගම විසින් සපයන ලද දත්තයන් පිළිබඳව නිරවද්‍යතාවය හා අංග සම්පූර්ණ බව සහතික කිරීමට මවිසින් සාධාරණ ක්‍රියාමාර්ග ගෙන ඇත.
4. රක්ෂණ ජාලය පනතේ අංක 26 වගන්තිය හා රක්ෂණ මණ්ඩලය විසින් බුන්වත් අංගය පිළිබඳව නිකුත් කර ඇති රෙගුලාසිද ඇතුලත් වූ නෛතික අවශ්‍යතාවලට අනුකූලව මවිසින් කටයුතු කර ඇත.
5. මගේ මතයේ හැටියට 2007 දෙසැම්බර් 31 දිනට සමාගමේ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වගකීම් සම්බන්ධයෙන් සමාගම සෑහෙන්නාවුද විධිමත් වුද සංචිතයන් වෙන් කර ඇත.
6. 2007 දෙසැම්බර් 31 දිනට දීර්ඝකාලීන රක්ෂණ අරමුදල, ලාභයක්ද ලබා ගනිමින් ඔප්පු හිමියන්ට ප්‍රසාද දීමනා වෙන් කිරීමට පෙර රුපියල් මිලියන 5.319 කින් ජීවගණකඥ තක්සේරුවට අවශ්‍ය සංචිත ඉක්මවා ලාභ ලබා ඇත.
7. 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය පාලනය කිරීමේ පනත යටතේ බුන්වත් තීරුව ඉක්මවා රුපියල් මිලියන 7.989% ඉක්මවා ගොස් ඇත.

අත්සන

Arahakachchi

ආර්. කහකච්චි
හවුල් ව්‍යාපාර කළමනාකරු හා ජීවගණකඥ

සමාගමේ මූල්‍ය ලේඛන පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පහත විස්තර කරනු ලැබේ. මෙම වගකීම 18 පිටුවේ විගණන වාර්තාවේ පැහැදිලි කර තිබෙන විගණකවරුන්ගේ වගකීමට වඩා වෙනස්ය.

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව අධ්‍යක්ෂකවරුන් විසින් සෑම ගිණුම් වර්ෂයක් සඳහාම එම වර්ෂයේ අවසන් දිනයට සමාගමේ තත්ත්වය නිරූපනය කරන්නා වූ මූල්‍ය ලේඛනයක්ද එම වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයක්ද සකස් කළ යුතු ය.

සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන්හි හා ඇස්තමේන්තුවල අනුබලය ලබා ගනිමින්ද අදාළ වන්නා වූ ගණකාධිකරණ ප්‍රතිපත්ති නිරසාර ලෙස යොදා ගනිමින්ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මග පෙන්වීම්වලට අනුකූල වෙමින්ද මේ සමග ඇති මූල්‍ය ලේඛන පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂකවරුන්ගේ විශ්වාසයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන්නාවුද, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ අවශ්‍ය කරන්නා වූ තොරතුරු සපයන්නාවුද, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්නාවුද, පරිදි මූල්‍ය ලේඛන සම්පාදනය කිරීමටත්, සාධාරණ නිරවද්‍ය භාවයකින් යුක්තව සමාගමේ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීමටත් හැකිවන ආකාරයට ගිණුම් පොත් පවත්වාගෙන යාම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වන්නේය. ඔවුහු තවදුරටත් සමාගමේ වත්කම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීමටත් එකී කාර්ය භාරය තුළ වංචා හා අක්‍රමිකතා වලක්වා ගැනීම හා හඳුනා ගැනීම පිණිස අවශ්‍ය වන්නාවූ අභ්‍යන්තර පාලනයන් ස්ථාපනය කර ගැනීමටත් වගකීමෙන් බැඳී සිටිති.

අධ්‍යක්ෂකවරු මූල්‍ය ලේඛන පිළියෙල කිරීමේදී නිරන්තරයෙන් අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගනිති. සමාගමේ මූල්‍ය පුරෝකථනයන් හා ණය මුදල් ලබා ගැනීමේ හැකියාවන්ද 2008 අය වැය ලේඛනයද සමාලෝචනයට හා විමර්ශනයට භාජනය කළ අධ්‍යක්ෂකවරු සිය කාර්යයන් කර ගෙනයාමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බව විශ්වාස කරති.

තම උපරිම දැනීමේ හා විශ්වාසයේ හැටියට සමාගම විසින් ව්‍යවස්ථාපිත හා නියාමක අධිකාරීන්ට ගෙවිය යුතුව තිබෙන සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා තිබෙන බවට නැතහොත් ගෙවීමට ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂකවරු සෑහීමට පත්ව සිටිති.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්
ලේකම්

මූල්‍ය සටහන්

විගණන වාර්තාව 18
ශේෂ පත්‍රය 19
ආදායම් ප්‍රකාශනය 20
අයිතිකාර ප්‍රාග්ධනයේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 21
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 22
ආදායම් ප්‍රකාශන - ආංශික සමාලෝචනය 2007 23
ආදායම් ප්‍රකාශන - ආංශික සමාලෝචනය 2006 24
ගිණුම්කරණ ප්‍රතිපත්ති 25
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 31

පී.ඊ. මැතිව් සහ සමාගම

වරලත් ගණකාධිකාරීන්

94 1/4, යෝක් වීදිය, කොළඹ - 01

විගණන වාර්තාව

සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගමේ සාමාජිකයින් වෙත

මූල්‍ය ලේඛණ පිළිබඳ වාර්තාව

සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගමේ 2007 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය ද ඊට අනුබද්ධිත එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අයිතිකාර ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ද, ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය හා පැහැදිලි කිරීමේ සටහන් ද අපි පරීක්ෂා කළෙමු.

ගිණුම් ප්‍රකාශන පිළිබඳව කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුව ඉහත දැක්වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකාරිත්වය සතුය. වංචා සහ වැරදි ඇතිවීම මගින් හෝ වේවා, යෝග්‍ය ගණකාධිකරණ ප්‍රතිපත්ති හඳුනා ගැනීමේ දී හා යොදා ගැනීමේ දී හෝ වේවා, අවස්ථානුකූල ගණකාධිකරණ ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී හෝ වේවා බරපතල සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව ගිණුම් පිළියෙල කිරීමටත් සාධාරණ ලෙස ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමටත් ඉවහල් වන්නා වූ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීමේ, ක්‍රියාවට නැංවීමේ හා පවත්වාගෙන යාමේ වගකීම ද ඊට ඇතුළත්ය.

විගණනයේ විෂය පථය හා විගණන මතයෙහි පදනම

අපගේ වගකීම වනුයේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් පල කිරීම ය.
අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව සිදු කරන ලදී. ඒ අනුව ඉහත සඳහන් කළ මූල්‍ය ප්‍රකාශනවල සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශනයන් අන්තර්ගත නොවන බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට අවශ්‍ය වන තරම් දුරට විගණන කටයුතු කරගෙන යාමත් විගණනය ඊට උචිත ලෙස සැලසුම් කිරීමත් අප විසින් කරන ලදී.

ඉහත කී මූල්‍ය ලේඛණවල දැක්වෙන සංඛ්‍යා හා අනාවරණය කිරීම් තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි නියැදි පදනමක් මත පරීක්ෂා කිරීම, යොදාගෙන තිබෙන ගිණුම්කරණ මූලධර්ම හා කළමනාකාරිත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තු තක්සේරු කිරීම, මූල්‍ය ලේඛණ සමස්ථයක් ලෙස ගත් කල ඒවායේ ඉදිරිපත් කිරීම ඇගයීමකට ලක් කිරීම හා මෙකී මූල්‍ය ලේඛණ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුව පිළියෙල කර ඉදිරිපත් කර ඇද්දැයි පරීක්ෂා කිරීම විගණනයට අයත් ය.

විගණනයට අවශ්‍ය යැයි අපගේ දැහීමේ හා විශ්වාසයේ හැටියට අප කල්පනා කළ සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගත්තෙමු. එම නිසා මතයක් පල කිරීමට තරම් ප්‍රමාණවත් පදනමක් විගණනයෙන් ගොඩනැගී තිබෙන බව අපි විශ්වාස කරමු.

විගණන මතය

අපගේ පරීක්ෂණයන්ගෙන් පෙනීයනතාක් දුරට 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සමාගම විධිමත් පරිදි ගිණුම් පොත් පවත්වාගෙන ගොස් තිබෙන බවත් 2007 දෙසැම්බර් 31 දිනට සමාගමේ තත්ත්වය ද, එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය හා මුදල් ප්‍රවාහයන් ද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ලේඛණවලින් සත්‍ය හා සාධාරණ ලෙස පෙන්නුම් කරන බවත් අපගේ මතයයි.

වෙනත් නෛතික හා නියාමක අවශ්‍යතා සම්බන්ධයෙන් වූ වාර්තාව

මෙම මූල්‍ය ලේඛණ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවන්ට හා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පාලනය කිරීමේ පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වන බව ද අපගේ මතය යි.

සමාගමේ මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පැහැදිලිව පෙන්නුම් කිරීමේ අවශ්‍යතාව පිණිස ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් කර ඇති නියමයන්ට අනුකූල වන පරිදි සමාගම මගින් ගිණුම් පොත් පවත්වාගෙන යනු ලැබූ බව අපි වැඩිදුරටත් ප්‍රකාශ කරමු.

වරලත් ගණකාධිකාරීන්
කොළඹ
2008 මැයි 15

R.A. Jayaweera, M.B.A., F.C.A., F.S.C.M.A.

Phone: 2434474/2422596/2473519
Fax: 2431203
E-Mail: pemco@sltnet.lk

2007 දෙසැම්බර් 31 දිනට	සටහන්	2007 රු.	2006 රු.
වත්කම්			
ආයෝජන	2	423,274,800	307,601,936
දේපල, පිරියත සහ උපකරණ	3	48,099,752	23,748,283
රක්ෂණාවරණ ණය		644,778	216,522
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ		7,406,864	10,920,745
ලැබිය යුතු රක්ෂණ වාරික	4	36,796,466	17,598,930
වෙනත් වත්කම්	5	49,267,732	27,768,551
මුදල් සහ මුදල්මය වත්කම්	6	9,036,751	25,909,601
වත්කම්වල එකතුව		574,527,143	413,764,568
වගකීම් සහ කොටස් හිමියන්ගේ අයිතිය			
වගකීම්			
ජීවිත රක්ෂණ ප්‍රතිපාදනය	7	167,491,697	128,299,382
සාමාන්‍ය රක්ෂණ ප්‍රතිපාදනය	8	157,850,022	113,870,875
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම	9	4,827,917	3,315,132
කල්බදු ගිවිසුම යටතේ දිගුකාලීන බැඳීම්	10	4,560,595	3,099,324
වෙනත් වගකීම්	11	42,549,075	36,442,446
වගකීම් වල එකතුව		377,279,306	285,027,159
කොටස් හිමියන්ගේ අයිතිය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	12	165,362,220	106,734,584
ප්‍රත්‍යාගණන සංචිත		3,036,000	–
ආදායම් සංචිත - රඳවාගත් ඉපැයීම්		28,849,617	22,002,825
කොටස් හිමියන්ගේ අයිතිය		197,247,837	128,737,409
වගකීම් සහ කොටස් හිමියන්ගේ අයිතිය		574,527,143	413,764,568

මෙම මූල්‍ය ලේඛණ පිළියෙල කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුය. සමුපකාර රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

අරුණ තෙබුවන
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ලේඛන පිළියෙල කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. සමුපකාර රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී,

ඩබ්.එල්.ඒ. පීරිස්
සභාපති

ඩබ්. උපාලි හේරත්
කළමනාකාර අධ්‍යක්ෂක

25 සිට 40 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාවලම කොටසකි.

කොළඹ, ශ්‍රී ලංකාව
2008 මැයි 15

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2007 රු.	2006 රු.
ආදායම	01	361,243,416	265,590,572
දළ ලේඛණගත රක්ෂණ වාරික	13	390,083,858	281,187,816
අඩු කළා - ප්‍රතිරක්ෂකයින්ට කැප කළ වාරික		34,422,255	31,268,972
ශුද්ධ ලේඛණගත රක්ෂණ වාරික		355,661,603	249,918,844
නොඉපැයූ රක්ෂණ වාරිකවල ශුද්ධ වෙනස		(45,674,256)	(18,554,887)
ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික		309,987,347	231,363,957
ප්‍රතිලාභ, අලාභ සහ වියදම්			
රක්ෂණ හිමිකම්පෑම හා ප්‍රතිලාභ	14	(106,455,192)	(78,383,940)
ප්‍රාරක්ෂණ සහ රක්ෂණාවරණ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ද ඇතුළුව)		(23,997,872)	(20,981,671)
දිගුකාලීන රක්ෂණ අරමුදලේ වැඩිවීම - ජීවිත		(37,667,973)	(35,221,375)
ප්‍රතිලාභ, අලාභ සහ වියදම්වල එකතුව		(168,121,037)	(134,586,986)
ප්‍රාරක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිඵල		141,866,310	96,776,971
ගාස්තු, කොමිස්, ආයෝජන සහ වෙනත් ආදායම්			
ගාස්තු හා කොමිස් ආදායම		4,512,796	3,565,154
අයෝජනවලින් ලද ආදායම්	15	45,933,606	29,756,609
වෙනත් ආදායම්	16	809,667	904,852
		51,256,069	34,226,615
වියදම්			
මෙහෙයුම්, ආයෝජන අනුබද්ධිත හා පරිපාලන වියදම්	17	(161,271,366)	(117,662,886)
මෙහෙයුම්වලින් ලද ලාභය	18	31,851,013	13,340,700
පොලී වියදම	19	(655,523)	(738,317)
බදු අඩු කිරීමට පෙර ලාභය		31,195,490	12,602,383
ආදායම් බද්ද	20	(8,339,922)	(4,318,736)
වර්ෂයේ ශුද්ධ ලාභය		22,855,568	8,283,647
කොටසක ඉපැයීම	21	1.78	0.78

25 සිට 40 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාවලම කොටසකි.

2005 දෙසැම්බර් 31 දිනට ශේෂය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය					
	සාමාන්‍ය කොටස් රු.	වරණීය කොටස් රු.	අයදුම් හා විභජන ගිණුම රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	ඉදිරියට ගෙනා ලාභ රු.	එකතුව රු.
2005 දෙසැම්බර් 31 දිනට ශේෂය	100,127,170	–	9,414	–	24,783,021	124,919,605
වර්ෂයේ ශුද්ධ ලාභය	–	–	–	–	8,283,647	8,283,647
කොටස් නිකුත් කිරීම	6,598,000	–	–	–	–	6,598,000
ලාභාංශ 2005	–	–	–	–	(11,063,843)	(11,063,843)
2006 දෙසැම්බර් 31 දිනට ශේෂය	106,725,170	–	9,414	–	22,002,825	128,737,409
වර්ෂයේ ශුද්ධ ලාභය	–	–	–	–	22,855,568	22,855,568
කොටස් නිකුත් කිරීම	43,305,140	15,322,500	(4)	–	–	58,627,636
ප්‍රත්‍යාගණන අතිරික්තය	–	–	–	3,036,000	–	3,036,000
ලාභාංශ 2006	–	–	–	–	(16,008,776)	(16,008,776)
2007 දෙසැම්බර් 31 දිනට ශේෂය	**150,030,310**	**15,322,500**	**9,410**	**3,036,000**	**28,849,617**	**197,247,837**

25 සිට 40 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාවලම කොටසකි.

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා,	2007 රු.	2006 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල		
ගණුදෙනුකරුවන්ගෙන් ලැබුණු රක්ෂණ වාරික	373,238,681	280,092,555
ගෙවූ ප්‍රතිරක්ෂණ වාරික	(29,800,366)	(27,205,633)
ලැබුණු කොමිස් අඩුකර ගෙවූ හිමිකම් පෑම්	(104,307,727)	(65,325,192)
ගෙවූ කොමිස්	(28,272,703)	(20,233,403)
සේවක මණ්ඩලයට හා ඔවුන් වෙනුවෙන් කළ ගෙවීම්	(56,919,945)	(39,226,171)
වෙනත් මෙහෙයුම් ගෙවීම්	(107,225,317)	(72,769,952)
ලැබුණු පොලිය	42,925,822	24,820,369
ලැබුණු ලාභාංශ	–	36,000
ලැබුණු වෙනත් ආදායම්	3,545,668	843,069
ගෙවූ ආදායම් බදු	(2,125,636)	(5,406,364)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල (සටහන් - A)	91,058,477	75,625,278
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල		
ආයෝජන (ආයෝජන විකිණීමෙන් ලැබූ මුදල අඩුකළ පසු)	(115,672,865)	(64,963,901)
මෝටර් රථ විකිණීම	502,926	231,990
භෞතික වත්කම් මිලට ගැනීම	(26,703,362)	(13,353,614)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල	(141,873,301)	(78,085,525)
මූල්‍යමය ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල		
කොටස් නිකුත් කිරීමෙන් ලැබුණු මුදල්	58,627,636	6,598,000
මූල්‍ය කල්බදු සඳහා ගෙවූ මුදල	(2,402,635)	(2,091,477)
ලාභාංශ ගෙවීම	(22,283,027)	–
මූල්‍යමය ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල	33,941,974	4,506,523
මුදල් හා මුදල්මය වත්කම්වල වැඩිවීම	(16,872,850)	2,046,276
ජනවාරි 01 දිනට මුදල් හා මුදල්මය වත්කම්	25,909,601	23,863,325
දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල්මය වත්කම් (සටහන් - B)	9,036,751	25,909,601
සටහන් A - මෙහෙයුම් ලාභය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල සමඟ සැසඳීම		
මෙහෙයුම් ලාභය	22,855,568	8,283,647
දිගුකාලීන රක්ෂණ වෙන්කිරීමේ වැඩිවීම	37,673,973	35,221,374
වත්කම් සඳහා ක්ෂය	8,462,910	7,219,120
ලැබිය යුතු වත්කම්වල වැඩිවීම	(31,701,042)	(6,661,802)
ගෙවිය යුතු වගකීම්වල වැඩිවීම/(අඩුවීම)	7,285,816	5,571,400
සංචිතවල වැඩිවීම	45,674,256	17,253,321
මෝටර් රථ විකිණීමෙන් ලාභය	(212,727)	(61,782)
කල්බදු නිවිසුම මත පොලිය	655,523	–
තොගවල වැඩිවීම/(අඩුවීම)	364,200	8,800,000
	91,058,477	75,625,278
සටහන් - B - දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල්මය වත්කම්		
අත ඉතිරි මුදල්	28,261,623	27,784,866
බැංකුවේ ඇති මුදල්	238,569	163,059
මාර්ගස්ථ මුදල්	2,623,612	1,713,326
බැංකු අයිරාව	(22,087,053)	(3,751,650)
	9,036,751	25,909,601

25 සිට 40 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාවලම කොටසකි.

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ජීවිත නොවන රු.	ජීවිත රු.	එකතුව රු.
දළ ලේඛණගත රක්ෂණ වාරික	289,691,043	100,392,815	390,083,858
අඩු කළා : ප්‍රතිරක්ෂකයින්ට කැප කළ වාරික	31,508,646	2,913,609	34,422,255
ශුද්ධ ලේඛණගත රක්ෂණ වාරික	258,182,397	97,479,206	355,661,603
නොඉපයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස	(45,674,256)	–	(45,674,256)
ඉපයූ ශුද්ධ රක්ෂණ වාරික	212,508,141	97,479,206	309,987,347
ප්‍රතිලාභ සහ අලාභ			
රක්ෂණ හිමිකම්පෑම හා ප්‍රතිලාභ	(99,443,603)	(7,011,589)	(106,455,192)
ප්‍රාරක්ෂණ සහ රක්ෂණාවරණ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ද ඇතුළුව)	(9,816,326)	(14,181,546)	(23,997,872)
දිගුකාලීන රක්ෂණ අරමුදලේ වැඩිවීම	–	(37,667,973)	(37,667,973)
මුලු ප්‍රතිලාභ, අලාභ සහ වියදම්	109,259,929	58,861,108	168,121,037
ප්‍රාරක්ෂණයේ ප්‍රතිඵලය	103,248,212	38,618,098	141,866,310
වෙනත් ආදායම්			
ගාස්තු හා කොමිස් ආදායම	4,512,796	–	4,512,796
ආයෝජනවලින් ලද ආදායම්	23,371,940	22,561,666	45,933,606
වෙනත් ආදායම්	778,221	31,446	809,667
	28,662,957	22,593,112	51,256,069
වියදම්			
මෙහෙයුම්, ආයෝජන අනුබද්ධිත හා පරිපාලන වියදම්	(101,756,887)	(59,514,479)	(161,271,366)
මෙහෙයුම්වලින් ලද ලාභය	30,154,282	1,696,731	31,851,013
පොලී වියදම	(533,217)	(122,306)	(655,523)
බදු අඩු කිරීමට පෙර ලාභය	29,621,065	1,574,425	31,195,490
ආදායම් බද්ද	(8,339,922)	–	(8,339,922)
වර්ෂයේ ශුද්ධ ලාභය	21,281,143	1,574,425	22,855,568

25 සිට 40 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාවලම කොටසකි.

2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ජීවිත නොවන රු.	ජීවිත රු.	එකතුව රු.
දළ ලේඛණගත රක්ෂණ වාරික	207,492,855	73,694,961	281,187,816
අඩු කළා : ප්‍රතිරක්ෂකයින්ට කැප කළ වාරික	28,304,473	2,964,499	31,268,972
ශුද්ධ ලේඛණගත රක්ෂණ වාරික	179,188,382	70,730,462	249,918,844
නොඉපයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස	(18,554,888)	–	(18,554,888)
ඉපයූ ශුද්ධ රක්ෂණ වාරික	160,633,494	70,730,462	231,363,956
ප්‍රතිලාභ සහ අලාභ			
රක්ෂණ හිමිකම්පෑම හා ප්‍රතිලාභ	(74,842,537)	(3,541,403)	(78,383,940)
ප්‍රාරක්ෂණ සහ රක්ෂණාවරණ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ද ඇතුළුව)	(9,019,233)	(11,962,438)	(20,981,671)
දිගුකාලීන රක්ෂණ අරමුදලේ වැඩිවීම	–	(35,221,374)	(35,221,374)
	(83,861,770)	(50,725,215)	(134,586,985)
ප්‍රාරක්ෂණයේ ප්‍රතිඵලය	76,771,724	20,005,247	96,776,971
වෙනත් ආදායම්			
ගාස්තු හා කොමිස් ආදායම	3,565,154	–	3,565,154
ආයෝජනවලින් ලද ආදායම්	18,019,617	11,736,992	29,756,609
වෙනත් ආදායම්	892,928	11,924	904,852
	22,477,699	11,748,916	34,226,615
වියදම්			
මෙහෙයුම්, ආයෝජන අනුබද්ධිත හා පරිපාලන වියදම්	(85,908,723)	(31,754,163)	(117,662,886)
මෙහෙයුම්වලින් ලද ලාභය	13,340,700	–	13,340,700
පොලී වියදම	(738,317)	–	(738,317)
බදු අඩු කිරීමට පෙර ලාභය	12,602,383	–	12,602,383
ආදායම් බද්ද	(4,318,736)	–	(4,318,736)
වර්ෂයේ ශුද්ධ ලාභය	8,283,647	–	8,283,647

25 සිට 40 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාවලම කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අනුගමනය කරන ලද මූලික ගිණුම් ප්‍රතිපත්ති පහත විස්තර කරනු ලැබේ:

1. පොදු

සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගම වූකලී ශ්‍රී ලංකාව තුළ රක්ෂණ කටයුතු පවත්වාගෙන යාම සඳහා සංස්ථාපිත සමාගමකි. මෙම සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරික මූලස්ථානය කොළඹ - 03, ගාලු පාර, අංක 455 දරන ස්ථානයේ පිහිටා ඇත.

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම සඳහා 2008 මැයි මස 15 දින කළමනාකාරිත්වයේ අනුමැතිය ලැබී තිබේ.

1.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් පිළිගෙන තිබෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ එකී ආයතනයේ අනුමැතිය ලත් රක්ෂණ ගිවිසුම් සඳහා නිර්දේශිත ක්‍රියා මාර්ගය පිළිබඳව වූ ප්‍රකාශනයට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

1.2 ගිණුම් පිළියෙල කළ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. ගිණුම් ප්‍රතිපත්ති පූර්ව වර්ෂය සමඟ ගැලපෙන පරිදි සකස් කර ඇත.

වත්කම්, බැරකම් සහ කොටස් හිමියන්ගේ අයිතිය පිළිබඳ තොරතුරු ශේෂ පත්‍රයේ සඳහන් ය. ජීවිත රක්ෂණ අරමුදලේ වත්කම් සහ බැරකම් පිළිබඳ තොරතුරු ජීවිත රක්ෂණය පිළිබඳ ශේෂ පත්‍රයේ අන්තර්ගත වේ.

කොටස්කරුවන්ගේ ප්‍රාරක්ෂණ, ආයෝජන සහ වෙනත් ආදායම් පිළිබඳ තොරතුරු ආදායම් ප්‍රකාශනයෙහි පෙන්නුම් කෙරේ.

1.3 ආංශික වාර්තා

සමාගමේ කළමනාකාරිත්ව ව්‍යුහය මගින් නිරූපනය කෙරෙන රක්ෂණ කර්මාන්තයේ විවිධ අංශ පදනම් කොට ගෙන ආංශික තොරතුරු සම්පාදනය කර ඇත. සමාගමේ සේවාවන් හෝ රක්ෂණාවරණ අලෙවි කරනු ලබන අංශ හෝ සමාගමේ ක්‍රියාකාරකම් පදනම් කොට ගෙන අංශ කවරේද යන්න නිගමනය කරනු ලැබේ.

2. වත්කම් සහ ඒවායේ අගය තක්සේරු කිරීමේ පදනම

2.1 ශුද්ධ අයිතිය ඇති වත්කම්

සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර ලබා ගන්නා වූ අගය පදනම් කරගෙන හෝ පිරිවැය පදනම් කරගෙන දේපල, පිරියත සහ උපකරණ වටිනාකම පෙන්නුම් කර ඇත. සාමාන්‍ය වටිනාකම (වෙළඳපොල වටිනාකම) සහ පොත්වල සඳහන් වටිනාකම අතර සැලකිය යුතු වෙනසක් විද්‍යාමාන වන කල්හි, දේපල, පිරියත සහ උපකරණ ප්‍රතිතක්සේරු කිරීමක් කරනු ලැබේ. අනතුරුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18, දේපල, පිරියත සහ උපකරණ, යටතේ එකී ප්‍රතිතක්සේරුව ගිණුම් ගත කරනු ලැබේ. ප්‍රතිතක්සෙරුව කරනු ලබන්නේ ඒ සඳහා වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවකු විසිනි.

දේපල, පිරියත සහ උපකරණ පිරිවැය යනු, අපේක්ෂිත කාර්ය සාධන මට්ටමට පත් කර ගැනීමට දරන්නට සිදුවන වියදම් ද ඇතුලත් ව, කිසියම් දේපලක් අත්පත් කර ගැනීමේ හෝ නිර්මාණය කිරීමේ පිරිවැයයි.

ව්‍යාපාරය පවත්වා ගෙයාම පිණිස උපයෝගී කර ගැනීම සඳහා හෝ ඉපැයීමේ හැකියාවන් නංවාලීම සඳහා හෝ ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම හෝ ඒවා පුළුල් කිරීම හෝ සංවර්ධනය කිරීම විෂයෙහි කරනු ලබන වියදම්, ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලැබේ.

2.2 ප්‍රත්‍යගණන වත්කම්

ස්වාධීන තක්සේරුකරුවකු වන මාතර, ගොඩගම, අකුරැස්ස පාරේ 237/2 හි පදිංචි ප්‍රේම මුණසිංහ මහතා විසින් සමාගම සතු ඉඩම ප්‍රත්‍යාගණන කරන ලදී. මෙම ප්‍රත්‍යාගණනයට අදාල දිනය වූ 2007.11.15 දිනයේ දී ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල ගිණුම් වාර්තාවලට ඇතුලත් කර තිබේ. මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කර තිබෙන්නේ විවෘත වෙළඳපොල වටිනාකම අනුවය. ප්‍රත්‍යාගණනයෙන් පැනනැගුන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කර තිබේ.

2.3 කල් බදු වත්කම්

අවදානම සහ ප්‍රතිලාභ පිළිබඳ අයිතිය මුළුමනින්ම පාහේ සමාගම විසින් දරන්නා වූ කල්බදු, මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණයට බඳුන් වේ. මූල්‍ය කල්බදු යටතේ අත්පත් කර ගන්නා වත්කම් ඒවායේ සාධාරණ අගයට දක්වනු ලැබේ. ගෙවිය යුතු අවම කල්බදු

වාරිකවල වර්තමාන අගයෙන් සමුච්චිත පිරිවැය ද අඩු කිරීමෙන් ලැබෙන්නා වූ කල්බදු වගකීමෙන් මූල්‍ය ගාස්තු ඉවත්කර පොලි සහිත ණය යටතේ පෙන්නුම් කරනු ලැබේ. කල්බදු වාරිකවල ප්‍රාග්ධනය හා පොලිය යන කොටස් දෙකම අඩංගු ලෙසට සලකන අතර පොලිය ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලැබේ.

කල්බදු කාලසීමාව ඉකුත් වීමෙන් පසු අයිතිය නොපරවන්නේ නම් මිස කල්බදු යටතේ ලබාගත් වත්කම් ඒවායේ ඇස්තමේන්තුගත ජීව කාලය තුළ ලියා හරිනු ලැබේ. අයිතිය නොපවරන අවස්ථාවල දී ජීව කාලය හෝ කල්බදු කාලසීමාව යන දෙකින් අවු. 2 කාලය තුළ දී කපා හරිනු ලැබේ.

මෙහෙයුම් කල්බදු සඳහා ගෙවන වාරිකය එම ගෙවීම අදාල වන්නේ යම් වර්ෂයකට ද එම වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලැබේ.

2.4 ක්ෂයවීම්

ශුද්ධ අයිතිය ඇති ඉඩම් ක්ෂය කිරීමට භාජනය නොකෙරේ. අනෙකුත් සියළු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ ඇස්තමේන්තු අගය ඇස්තමේන්තුගත පලදායී ජීවන කාලය තුළ දී කපා හැරෙන පරිදි සරල මාර්ග ක්‍රමයට පහත දැක්වෙන අනුපාතවලට අනුකූලව ක්ෂය කරනු ලැබේ.

ශුද්ධ අයිතිය අති වත්කම්	වසරකට %
ගොඩනැගිලි	5
කාර්යාල උපකරණ	33 1/3
පරිඝණක	33 1/3
මෝටර් වාහන	25
ගෘහ භාණ්ඩ හා උපාංග	25
කල්බදු - මෝටර් වාහන	25

මිලයට ගත් වර්ෂය තුළ දී ක්ෂය කිරීම් ගණනය නොකෙරෙන අතර, විකිණූ, වර්ෂයේ දී එකී මුළු වර්ෂය සඳහාම ක්ෂය කිරීම් ගණනය කරනු ලැබේ.

2.5 ආයෝජන

සමාගම, ණය හා හිමිකම් සුරැකුම්පත්වල කරනු ලැබූ ස්වකීය ආයෝජන වර්ගීකරණය කර ඇත්තේ, අලෙවිය සඳහා රඳවා ගත්, කල් පිරෙන තෙක් රඳවා ගත් සහ අලෙවිය සඳහා විවෘත යන මාතෘකා ත්‍රිත්වය යටතේය. ආයෝජන අත්පත් කරගනු ලැබූ අවස්ථාවේ දී තීරණය කරනු ලැබූ ආයෝජන පරමාර්ථවලට අනුරූපීව වර්ගීකරණය සිදුකර ඇත. මිලයට ගනු ලබන අවස්ථාවේ දී කළමනාකාරිත්වය විසින් ආයෝජන වර්ගීකරණයට බඳුන් කරනු ලබන අතර එකී වර්ගීකරණයේ වලංගු භාවය නැවත නැවත සලකා බැලීමට භාජනය කරනු ලැබේ. මූලික වශයෙන් කෙටිකාලීන මිල උච්චාවචනය ඔස්සේ ලාභ ඉපයීමට බලාපොරොත්තුව අත්පත් කරගත් ආයෝජන, අලෙවිය සඳහා රඳවාගත් ආයෝජන යනුවෙන් හඳුන්වනු ලැබේ. ස්ථාවර කල්පිරීමක් ඇති සහ ස්ථාවර කල්පිරීම තෙක් රඳවා ගත් ආයෝජන ලෙස වර්ගීකරණය වේ.

කල්පිරෙන තෙක්, අවිනිශ්චිත කාල සීමාවක් තුළ රඳවා ගැනීමේ බලාපොරොත්තුව සහ හැකියාව තිබෙන්නා වූත්, බේරුම් කිරීමේ කාර්යයේ දී හෝ පොලී වෙනස්කමක් සිදුවූ අවස්ථාවක දී හෝ විකුණා දැමීමට හැකියාව ඇත්තා වූත් ආයෝජන, අලෙවිය සඳහා විවෘත ආයෝජන යන මාතෘකාව යටතේ වර්ගීකරණය කර තිබේ.

ආයෝජන මිලට ගැනීම හෝ විකිණීම සිදුකළ දිනයේ දී එනම් සමාගම විසින් විකිණීම හෝ මිලයට ගැනීමට කැප වී ඇති දිනයේ දී වත්කම හෝ ආයෝජන ගිණුම්ගත කරනු ලැබේ. පළමු කොට ආයෝජනය එහි සාමාන්‍ය වටිනාකමට එනම්, අත්පත් කර ගැනීමේ වටිනාකමට ගිණුම්ගත කරනු ලැබේ. ඊළඟට කරනු ලබන්නේ ක්‍රියාශීලී වෙළඳපොලක නිශ්චිත මිලක් නොමැති සහ සාධාරණ වටිනාකම විශ්වාසවන්ත ලෙස මැනිය නොහැකි පිරිවැයට මනිනු ලබන සුරැකුම්පත් හා අදාල කරගත හැකි ප්‍රයෝගික පොලී අනුපාතය යටතේ ලියා හරිනු ලබන පිරිවැය මගින් මනිනු ලබන කල්පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන හැර අනෙකුත් ආයෝජන, සාමාන්‍ය වටිනාකම අනුව මිනුම් කිරීමයි.

අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම් නිසා උත්පාදනය වන්නා වූ උපලබ්ධි වූ හෝ උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි පෙන්නුම් කරන අතර, අලෙවිය සඳහා විවෘත මූල්‍ය වත්කම් සෘජුවම, කොටස් කරුවන්ගේ අයිතිවාසිකම් ගිණුමෙහි පෙන්නුම් කරනු ලැබේ. කපා හරිනු ලබන අගයන්ට පෙන්නුම් කරන මූල්‍ය වත්කම් අත්හරිනු ලැබීමක් හෝ ඒවායේ අගය පිරිහීමක් සිදු වන්නේ නම් එම වත්කම් ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලැබේ.

2.6. තොග

පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු වටිනාකම මත තොග පෙන්නුම් කර ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු නිම කිරීමට යන පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් පිරිවැය අඩු කළා වූ ඇස්තමේන්තුගත විකුණුම් මිලයි. බර තැබූ සාමාන්‍ය අගය මත පිරිවැය නිශ්චය කරන ලැබේ.

2.7 මුදල් සහ මුදල් සමාන වත්කම්

අත ඉතිරි මුදල්, අනෙකුත් අතිශයින් ද්‍රවශීල ආයෝජන සහ බැංකු අයිරාවලින් මුදල් හා මුදල් සමාන වත්කම් සමන්විත වේ.

2.8 ලැබීමට තිබෙන වෙළඳ හා වෙනත් වත්කම්

ලැබීමට තිබෙන වෙළඳ හා වෙනත් වත්කම් ශුද්ධ උපලබ්ධි අගයට සඳහන් කර තිබේ.

3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී දැන ගන්නට ලැබී තිබුණ සියළු බැරකම් ගිණුම්ගත කර ඇත.

3.1 බදු ප්‍රතිපාදන

වර්ෂයේ ලාභය හෝ අලාභය මත පැන නගින්නා වූ බදු බැඳියාව වර්තමාන සහ පමාකල බදු යන දෙකින් සංයුක්ත වන අතර එම බදු බැඳියාව ආදායම් ප්‍රකාශනයන්හි පෙන්නුම් කර ඇත.

වර්තමාන බද්ද යනු වාර්ෂික ආදායම මත ශේෂ පත්‍ර දිනයේ දී වලංගුව පැවතියා වූ බදු අනුපාතික අනුව ගෙවීමට නියමිත බද්ද සහ ගෙවී ගිය වසරවල ගෙවිය යුතු බදුවලට කරනු ලබන ගැලපීම් යන දෙකේ එකතුවයි.

3.2 පමාකළ බදු

පමාකළ බදු විෂයයෙහි සත්‍ය බැරකමක් නුදුරු අනාගතයේ දී බිහිවනු ඇතැයි විද්‍යාමාන නොවන බැවින් පමාකළ බදු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැත. කාලානුරූපීව ඇතිවන්නා වූ නමුදු ගිණුම් වාර්තාවලට ඇතුලත් කර නැත්තා වූ වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 20 හි පෙන්වා ඇත.

ඉහත සටහනෙහි සඳහන් පමාකළ බදු නිර්නය කරනු ලැබුවේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා සැලකිල්ලට ගනු ලබන වත්කම් හා බැරකම්වල ප්‍රමාණය සහ බදු වාර්තාකරණය සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රමාණය අතර වෙනස මත ගණනය කිරීමක් වන්නා වූ ශේෂපත්‍ර බැරකම් රීතිය අනුව කටයුතු කිරීමෙනි.

3.3 වෙළඳ හා වෙනත් ගෙවීම්

වෙළඳ හා වෙනත් ගෙවීම් පිරිවැයට පෙන්නුම් කර ඇත.

3.4 රක්ෂණ ගිවිසුම් සඳහා නොවන ප්‍රතිපාදන

පසුගිය සිද්ධියක් හේතු කොට ගෙන, නීතිමය වශයෙන් හෝ වෙනත් ආකාරයකට හෝ ගොඩනැගෙන්නා වූ වගකීමක් සමාගමට ඇතිවූ විටෙක සහ එකී වගකීම ඉටු කිරීම් වස් ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වන්නේ යැයි අනුමාන කරනු ලබන විටෙක (රක්ෂණය සම්බන්ධ කොන්ත්‍රාත්වලට හැර) ඒ සඳහා ශේෂ පත්‍රයෙහි ප්‍රතිපාදන ඇතුලත් කරනු ලැබේ.

3.5 ශේෂපත්‍ර දිනයට පසුව සිදුවීම

ශේෂ පත්‍ර සකස් කළ දිනයට පසුව පැන නැගි සියළු සැලකිය යුතු සිද්ධීන් කල්පනාවට ගෙන, මූල්‍ය ප්‍රකාශනවල අදාල සටහන් යටතේ නිසි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

3.6 ප්‍රාග්ධන වගකීම් සහ අහඹු වැය

සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අහඹු බැරකම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත.

3.7 විශ්‍රාම ප්‍රතිලාභ

3.7.1. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

සමාගමෙහි වසරකට වැඩි කාලයක් සේවය කර ඇති සෑම සේවකයකුටම විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන සම්පාදනය කර තිබේ. කෙසේ වුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පිළිබඳ පනතට අනුව සේවකයෙකුට පාරිතෝෂික ගෙවීම පිළිබඳ වගකීම ඇතිවන්නේ පස් වසක අඛණ්ඩ සේවා කාලයක් ඉක්මයාමෙන් පසුව පමණි.

වෙන්කළ මෙම ප්‍රතිපාදන සමාගමෙන් පිටත ආයෝජනය කර නැත.

3.7.2 නිශ්චිත දායක මුදල් සැලසුම්

සියළුම සේවකයින් ආවරණය වන පරිදි සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීම සඳහා ඇති වගකීම වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයෙහි පෙන්නුම් කර ඇත.

4. කොටස් ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, කොටස් හිමියන්ගේ අයිතිය ලෙස ශ්‍රේණිගත කර ඇත.

5. සාමාන්‍ය හෙවත් ජීවිත රක්ෂණ නොවන ව්‍යාපාරය

5.1 වාරික

රක්ෂණ ඔප්පුවක ආරම්භයේ දී ලේඛණගත කර ඇති ප්‍රමාණයට වාරික ගිණුම්ගත කරනු ලැබේ. රක්ෂණ ගිවිසුම ආරම්භයේ දී ලේඛණගත කරනු ලබන වාරික, රක්ෂණ ආවරණය බලපවත්නා කාලවකවානුව තුළ සමානුපාතික පදනමක් මත ඉපැයූ ආදායමක් ලෙස සටහන් කරගනු ලැබේ. කෙසේ වුවද, අවදානම් කාලය, ගිවිසගත් කාලයට වඩා සැලකිය යුතු පරිදි වෙනස්වන අවස්ථාවල දී එම කාලවකවානුව තුළ සපයනු ලබන රක්ෂණාවරණයේ ප්‍රමාණයට සමානුපාතිකව ඉපැයූ ආදායම ගණන් බලනු ලැබේ.

පැවරීම කරනු ලබන සමාගම් විසින් සපයනු ලබන තොරතුරු පදනම් කරගෙන උපකල්පිත ප්‍රතිරක්ෂණ වාරික තක්සේරු කරනු ලැබේ. මෙම තක්සේරුවට උපයෝගී කරගනු ලබන තොරතුරු සමාලෝචනය කර යම් ගැලපීමක් කළයුතු බව පෙනීගිය හොත් ඊට තුඩුදුන් සාධක උද්ගත වූ කාල පරිච්ඡේදය තුළ දී එම ගැලපීම කරනු ලැබේ. වාරික ඉපයීම කරනු ලබන්නේ අදාල ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට අනුකූලවය.

5.2 නොඉපැයූ රක්ෂණ වාරික

ලේඛණගත කළ වාරිකවලින් යම් කොටසක් තවම හමාර නොවූ රක්ෂණාවරණ කාල පරිච්ඡේදයට අදාල වන්නේ ද එම කොටස නොඉපැයූ රක්ෂණ වාරික සංචිතයෙහි අන්තර්ගත කර තිබේ.

5.3 අහෝසි නොවූ අවදානම

ඇස්තමේන්තු කරනු ලබන අනාගත හිමිකම්පෑම් සහ අදාල වැය බේරුම් කිරීම සඳහා නොඉපැයූ රක්ෂණ වාරික ඉක්මවා යන යම් මුදල් ප්‍රමාණයක් දෙසැම්බර් 31 වන දිනට පැවති ව්‍යාපාරික තත්ත්වයට අනුව අවශ්‍ය යැයි හැඟී ගිය විට අවස්ථාවෝචිත පරිදි ප්‍රතිපාදන සලසනු ලැබේ.

කෙසේ වුවද, 2006 දෙසැම්බර් 31 දක්වා වූ කාලසීමා සඳහා අහෝසි නොවූ අවදානම විෂයයෙහි ප්‍රතිපාදනයක් වෙන්කර නැත.

5.4 ලැබිය යුතු ආදායම්

රක්ෂණ වාරික සහ වෙනත් ණයගැතියන් ලැබිය යුතුව තිබෙන මුදල් ප්‍රමාණයට පෙන්නුම් කරනු ලැබේ. රක්ෂණ වාරික සහ අනෙකුත් ණයගැතියන්ගෙන් අයවීමට තිබෙන මුදල් එකතුකර ගැනීමට ඇති හැකියාව නිරන්තරව සමාලෝචනය කෙරේ. අයකර ගැනීමට නොහැක්කේ යයි හඳුනාගත් ණය ලියාහරිනු ලැබේ. අයකර ගැනීම පිළිබඳ සැකයක් ඇතිවුවහොත් අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් කරනු ලැබේ. එසේ වුවද යම් ලැබිය යුතු මුදලක් දින 180 ක් කල් ඉක්මවා තිබුණහොත් නියත වශයෙන්ම එම මුදල තුළ අන්තර්ගත ඉපයූ වාරිකයේ ප්‍රමාණයට අඩමාන ණය වෙන්කරනු ලැබේ.

ගෙවූ සහ නොගෙවූ අලාභ ගැලපුම් වැය, පැවරූ නොඉපැයූ වාරිකා, පැවරූ නොඉපැයූ අනාගත ජීවිත රක්ෂණ ප්‍රතිලාභ සහ ප්‍රතිරක්ෂණ ගිවිසුම් යටතේ රඳවා ගෙන ඇති මුදල් වලින් ප්‍රතිරක්ෂණ ගිවිසුමේ අඩංගු හිමිකම්වලට අනුරූපිව තක්සේරු කරනු ලැබේ. අන් අයුරකින් හිලව් කිරීමක් සඳහා අයිතියක් නොමැත්තේ නම් දළ ප්‍රතිරක්ෂණය ඒකාබද්ධ ශේෂ පත්‍රයෙහි සඳහන් කෙරේ.

5.5 බාහිර ප්‍රතිරක්ෂණය

ප්‍රතිරක්ෂිතයින්ට පවරනු ලබන රක්ෂණ වාරික ප්‍රතිරක්ෂණ සේවා ලබාගන්නා පිළිවෙල අනුව වියදම් හැටියට හඳුනාගනු ලැබේ. මේ අනුව ප්‍රතිරක්ෂණ වාරිකවලින් කොටසක් පෙර ගෙවුමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ.

5.6 හිමිකම්

සෘජු රක්ෂණ ව්‍යාපාර හා දෙනු ලබන ප්‍රතිරක්ෂණ ව්‍යාපාර විෂයයෙහි උද්ගත වන්නා වූ හිමිකම් පෑම්වලට අදාල වැය ද, නොපියවූ හිමිකම් පෑම් ද ගිණුම්වල දී හඳුනා ගැනේ. වාර්තාකළ එහෙත් මෙතෙක් නොගෙවූ හිමිකම්, උද්ගත වූ එහෙත් මෙතෙක් වාර්තා නොවූ හිමිකම් සහ හිමිකම් බේරුම් කිරීම සඳහා අපේක්ෂිත සෘජු සහ වක්‍ර පිරිවැය වලින් මෙම බැරකම සංයුක්ත වේ. හිමිකම් පෑම්වලට අදාල ඒ ඒ ලිපිගොනු සමාලෝචනය කිරීමෙන් හා අත්දැකීම් සහ හැඹුරුවීම් පදනම් කරගත් සංඛ්‍යාලේඛණ

සැලකිල්ලට ගනිමින් හිමිකම් පෑම් ද, උද්ගත වූ නමුත් වාර්තා නොකළ හිමිකම්පෑම් ද අවසාන වශයෙන් පියවීමට උවමනා කරන පිරිවැය ද සැලකිල්ලට ගෙන නොපියවූ හිමිකම් පෑම් තක්සේරු කරනු ලැබේ.

අපේක්ෂිත හිමිකම් පෑම් සහ පිරිවැය අවාරණය කිරීම සඳහා අනාගත රක්ෂණ වාරික සහ ආයෝජන කළඹක සමානුපාතික ඉපයීම් ප්‍රමාණවත් නොවන්නේ නම් එවිට, අපේක්ෂිත අලාභ පිළිබඳ ප්‍රතිපාදන වෙන් කිරීමක් අවශ්‍ය වේ.

හිමිකම් පෑම් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන දැනට බලපවත්නා තත්ත්වයන් යටතේ ප්‍රමාණවත් ලෙස සටහන්ව ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය සලකනු ලැබුවේ මුත්, ඉදිරියේ දී එළඹෙන්නා වූ තත්ත්වයන් හා සිද්ධීන් කරණකොට ගෙන අවසාන බැරකම විචලනය වීමට ඉඩ තිබේ. එවැනි තත්ත්වයක දී වෙන්කර ඇති ප්‍රමාණයන් යලි ගැලපීමට සිදුවන ඇත. එවැනි යම් ගැලපීමක් වෙතොත් එය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබේ. අනුගමනය කරනු ලබන ක්‍රමවේද සහ සිදුකරනු ලබන තක්සේරු කිරීම් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ.

5.7 පමා වූ අත්පත් කර ගැනීමේ පිරිවැය

උත්පාදනය කරනු ලබන ව්‍යාපාරික ගණුදෙනු ප්‍රමාණයට කෙලින්ම සම්බන්ධ වන්නාවූ ද ඒ සමග අඩු වැඩි වන්නා වූ ද කොමිස්, වාරික මත වූ බදු සහ වෙනත් ප්‍රාරක්ෂණ වියදම්වලින් සැදුම්ලත් අත්පත් කර ගැනීමේ පිරිවැය වෙනම රඳවා තබාගෙන අදාල ලේඛණගත රක්ෂණ වාරික උපයනු ලබන කාල සීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

ආයෝජන ආදායමද ඇතුලත් වන්නා වූ, අනාගත ඉපයීම් මගින් පමාකළ රක්ෂණ ඔප්පු අත්පත් කර ගැනීමේ පිරිවැය අයකර ගත හැකිදැයි යන්න නිරතුරු සමාලෝචනයට ලක් කෙරේ. එකී පිරිවැය අයකර ගත නොහැකි ලෙස තක්සේරු කරන්නේ නම් වියදමක් ලෙස කපා හැරේ.

6. ජීවිත රක්ෂණ ව්‍යාපාරය

6.1 රක්ෂණ වාරික (ආදායම්)

සහභාගිත්ව ගිවිසුම් සහ ජීවිත රක්ෂණය අහඹු වගකීම් ලෙස දක්වා තිබෙන වාර්ෂික රක්ෂණ ඔප්පු ද ඇතුලත්ව සියළුම සාම්ප්‍රදායික ජීවිත රක්ෂණ ගිවිසුම්වලට අදාලව ඔප්පු හිමියන්ගෙන් ලැබෙන්නා වූ මුදල් ආදායම් ලෙස සලකනු ලැබේ. රක්ෂණ ඔප්පු වලංගුව පවතින ආයුකාලය තුළ හඳුනාගත යුතු ලාභ මැන ගැනීම සඳහා එකී ආදායම්වලට එරෙහිව ගෙවිය යුතු ප්‍රතිලාභ සහ වියදම් ගැලපිය යුතු වන්නේ ය.

තවද, ජීවිත රක්ෂණවල දී අපේක්ෂිත ප්‍රතිලාභ ගෙවීම්වල ප්‍රමාණය අඩු කිරීමෙන් පසුව ද ඒක වාරික ගිවිසුම්වල දී රක්ෂණ වාරිකයේ අඩංගු යම් අධිලාභයක් වෙතොත් එය කල්දැමීමෙන් පසුව ද ලැබෙන්නා වූ රක්ෂණ වාරික, ආදායම් ලෙස සටහන් කර, බලපවත්නා රක්ෂණ සමග නියත සම්බන්ධතාවයක් ඇති වන පරිදි ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. ඒකක/බද්ධ හෝ ලාභ ඇතුලත් ඒකක වැනි ආයෝජන ස්වරූපයේ ගිවිසුම්වලින් එකතුකර ගනු ලබන්නා වූ රක්ෂණ වාරික වාර්තාගත කරනු ලබන්නේ තැන්පත් වශයෙනි. අදාල කාල පරිච්ඡේදය තුළ රක්ෂණ වාරික වාර්තාගත කරනු ලබන්නේ තැන්පත් වශයෙනි. අදාල කාල පරිච්ඡේදය තුළ රක්ෂණය පවත්වාගෙන යාමේ සහ අත්හැරීමේ පිරිවැය අන්තර්ගත රක්ෂණ ගාස්තුවලින් මෙම ගිවිසුම්වලට අදාල ආදායම සමන්විත වේ. රක්ෂණ ගිවිසුමෙහි තක්සේරුගත ජීව කාලය පදනම් කර පෙරමුණු- කෙලවර ගාස්තු නිගමනය කෙරේ. කාල පරිච්ඡේදය තුළ යම් ප්‍රතිලාභ හිමිකම්පෑමක් රක්ෂණ ගිවිසුම් ලාභියාගේ තැන්පතුව හා එම තැන්පතුව බැර කළ පොලිය ඉක්මවා යන්නේ යම් ප්‍රමාණයකින් ද එම ප්‍රමාණය රක්ෂණ ප්‍රතිලාභ සහ හිමිකම් පෑමේ වියදමට එකතු කරනු ලැබේ.

6.2 පමාකළ අත්පත් කර ගැනීම් පිරිවැය

වට්ටම්, ප්‍රාරක්ෂණය, අලෙවිය සහ රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේ වියදම් ද ඇතුලත් නව ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පිරිවැය පමාකරනු ලැබේ. පමාකළ අත්පත් කර ගැනීමේ පිරිවැය, රක්ෂණ ඔප්පු නිකුත් කළ දිනයේ දී සහ එක් එක් ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වන දිනයේ දී අයකර ගැනීමේ පරීක්ෂාවකට යටත් කෙරේ.

රක්ෂණ ඔප්පු හිමියන් අතර ලාභාංශ බෙදාදීමේ දී දායකත්ව ක්‍රමය බලපවත්වන්නා වූ සම්ප්‍රදායානුකූල ජීවිත රක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් වූ පමාකළ රක්ෂණ ඔප්පු අත්පත් කර ගැනීමේ පිරිවැය, තක්සේරුගත දළ ලාභයෙන් නිත්‍ය ප්‍රතිශතයක් වන ලෙස ජීවිත රක්ෂණ ගිවිසුම්වල අපේක්ෂිත ජීව කාලය පුරා බෙදා වෙන්කරනු ලැබේ. ප්‍රතිලාභ සහ පරිපාලන වියදම්, රක්ෂණ වාරික සංචිතයේ ශුද්ධ වෙනස්වීම් සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ලාභාංශ යන මේවා යෝග්‍ය පරිදි අඩු කිරීමෙන් පසුව ගණන් ගනු ලබන අපේක්ෂිත රක්ෂණ වාරික සහ ආයෝජන ප්‍රතිඵල, තක්සේරුගත දළ ලාභයට ඇතුලත් වේ. ඉපයීම්වල පෙන්නුම් කෙරෙන තක්සේරුගත අත්දැකීම් හා සත්‍ය ප්‍රතිඵල වෙනස්වීම් සමග තක්සේරුගත දළ ලාභ අඛණ්ඩ තක්සේරුවකට බඳුන් කෙරේ.

රක්ෂණ ඔප්පු අත්පත් කර ගැනීමේ පමාකළ පිරිවැය, සම්ප්‍රදායානුකූල වෙනත් ජීවිත රක්ෂණ සහ වාර්ෂික ජීවිත රක්ෂණ පිළිබඳව ගත් කල්හි, අදාල රක්ෂණ ඔප්පුවල අපේක්ෂිත ජීව කාලය තුළ පැතිර පවතින්නා වූ අපේක්ෂිත රක්ෂණ වාරිකවල නිත්‍ය ප්‍රතිශතයක් ලෙස බෙදා හරිනු ලැබේ. අපේක්ෂිත රක්ෂණ වාරිකය රක්ෂණ ඔප්පුව නිකුත් කරන දිනයේදීම තක්සේරු කරනු ලබන අතර එය රක්ෂණ වාරික ඌනතාවයක් සිදුවූයේ නැත්නම්, මුළු රක්ෂණ ජීව කාලය පුරා බලපවත්වන්නා වූ නිත්‍ය රක්ෂණ වාරිකය වනවා ඇත.

සාමාන්‍ය ජීවිත රක්ෂණ, ඒකක-බද්ධ සහ ලාභ ඇතුලත් ඒකක වැනි ආයෝජන ස්වරූපයේ ගිවිසුම්වලට අදාල වූ ඔප්පු අත්පත් කර ගැනීමේ පමාකළ පිරිවැය, ඇස්තමේන්තුගත දළ ලාභයේ වත්මන් වටිනාකම ගිවිසුමේ මුළු ජීව කාලය තුළ දී උපයාගත හැකි වන පරිදි සම්පාදනය කළ නිත්‍ය ප්‍රතිශතයක් පදනම්ව, ගිවිසුම්වල මුළු ජීව කාලය පුරා බෙදා වෙන්කරනු ලැබේ. ඔප්පු හිමිකරු ශේෂ, පරිපාලන වියදම් සහ බැර කළ පොලි ඉක්මවා ඉදිරිපත් කරනු ලබන ප්‍රතිලාභ ඉල්ලීම් අඩු කිරීමෙන් පසුව, මරණය, පරිපාලන, ආයෝජන සහ කල්පිරීම සඳහා තක්සේරු කරනු ලැබිය හැකි යයි අපේක්ෂිත ප්‍රමාණයන් ඇස්තමේන්තුගත දළ ලාභයෙහි අන්තර්ගත වේ. ඇස්තමේන්තුගත දළ ලාභය නිරතුරුව ප්‍රතිශෝධනය කරනු ලබන අතර, අපේක්ෂිත දළ ලාභයේ ප්‍රතිසංශෝධිත ඇස්තමේන්තුවල වත්මන් වටිනාකම ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලබන පොලී අනුපාතය, ඉතිරි ප්‍රතිලාභ කාල සීමාව සඳහා භාවිතයට ගත යුතු අළුත්ම අනුපාතය වේ. ඇස්තමේන්තු ගත අත්දැකීම්වලින් බැහැර වූ නිත්‍ය ප්‍රතිපල, ඉපැයීම්වල විද්‍යාමාන වේ.

6.3. ප්‍රතිරක්ෂණ ගිවිසුම්

පිටතට ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික, ගෙවීම් කරන අවස්ථාවේ දී ගිණුම්වල හඳුනා ගැනේ. අදාල හිමිකම් පෑම්වල දළ වටිනාකමට ගැලපෙන සේ, ප්‍රතිරක්ෂණ ලැබිම් කරනු ලැබේ.

6.4 හිමිකම්

මරණ හිමිකම්, ලත් දැනුම්දීම් මත වාර්තාගත කෙරේ. කල්පිරීම් සහ වාර්ෂික ගෙවීම් වාර්තාගත කරනු ලබනුයේ ඒවා ගෙවිය යුතු දින වලදීය. සහභාගිත්ව රක්ෂණාවරනවලට අදාල හිමිකම්වලට ගෙවිය යුතු ප්‍රසාද මුදල් හා පොලී ඇතුලත් වේ. ගෙවිය යුතු හිමිකම්වලට බේරුම් කිරීමේ සෘජු වියදම් ද ඇතුලත් ය.

අන්තර්වාර ගෙවීම් සහ කල්පිරීම්, එකී ගෙවීම් සිදු කරනු ලබන අවස්ථාවේ දී ගිණුම්ගත කරනු ලැබේ.

6.5 ශිල්පීය ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ ව්‍යාපාර ප්‍රතිපාදන සහ බද්ධ වූ බැරකම් සඳහා ප්‍රතිපාදන

ජීවිත රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව, ජීවදත්ත, ගණක නිලධාරීන් විසින් ස්වකීය වාර්ෂික පරීක්ෂණ වාර්තාවෙන් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ, සමාගමේ ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතයට ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වෙයි.

අවිනිශ්චිත බැර ද ඇතුළුව සියළු බැර සැලකිල්ලට ගැනීමෙන් සහ උපදේශක ජීවදත්ත ගණක නිලධාරීන්ගේ උපකල්පනය මත පදනම් වූ නිර්දේශ ඇතුලත් කිරීමෙන් ජීවදත්ත ගණක වාර්තාව සකස් කෙරේ.

7. සංසන්දනාත්මක සංඛ්‍යා

අවශ්‍ය තන්හි, සන්සන්දනාත්මක සංඛ්‍යා, වත්මන් වසරේ ඉදිරිපත් කිරීම්වලට ගැලපෙන පරිදි ප්‍රතිවර්ගීකරණය කරන ලදී.

2007 දෙසැම්බර් 31 දිනට	2007 රු.	2006 රු.
1. ආදායම		
දළ රක්ෂණ වාරික	390,083,858	281,187,816
ප්‍රතිරක්ෂණ වාරික	(34,422,255)	(31,268,972)
ශුද්ධ රක්ෂණ වාරික	355,661,603	249,918,844
නොඉපැයූ රක්ෂණ වාරිකයන්හි ශුද්ධ වෙනස්වීම	(45,674,256)	(18,554,887)
ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික	309,987,347	231,363,957
ගාස්තු හා කොමිස් ආදායම	4,512,796	3,565,154
ආයෝජනවලින් ලද ආදායම්	45,933,606	29,756,609
වෙනත් ආදායම්	809,667	904,852
	361,243,416	265,590,572
2. ආයෝජන		
පරිණතවීම දක්වා තිබෙන -		
ආයෝජන - ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව -		
5% වසර 10 කින් කල්පිරෙන සුරැකුම් රහිත හා යටත් ණයකර	20,000,000	20,000,000
ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත් (2.1)	399,724,071	254,040,686
සංස්ථාගත ආයතන සුරැකුම්පත්	–	5,000,000
බැංකු තැන්පත් (2.2)	1,050,729	26,061,250
විකිණීම සඳහා තිබෙන -		
මිල ලැයිස්තුගත නොකළ ආයෝජන (2.3)	2,500,000	2,500,000
	423,274,800	307,601,936

2.1 ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම් පත්

	පිරිවැය/ක්‍රමක්ෂය පිරිවැය 2007 රු.	2006 රු.
ප්‍රතිමිලදී ගැනීම් ද ඇතුළුව භාණ්ඩාගාර බැඳුම්කර	144,424,559	254,040,686
ප්‍රතිමිලදී ගැනීම් ද ඇතුළුව භාණ්ඩාගාර බිල්පත්	255,299,512	–
	399,724,071	254,040,686

2.2 බැංකු තැන්පත්

ස්ථාවර තැන්පත්		
මහජන බැංකුව	1,050,729	16,061,250
සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැණි ලිමිටඩ්	–	10,000,000
	1,050,729	26,061,250

2.3 සාධාරණ අගය නිශ්චය කළ නොහැකි මිල ලැයිස්තුගත නොකළ සමාගම්හි කරන ලද ආයෝජන

	2007		2006	
	කොටස්	පිරිවැය (රු.)	කොටස්	පිරිවැය (රු.)
සීමාසහිත සමූපකාර කල්බදු සමාගම	250,000	2,500,000	250,000	2,500,000

3 දේපල, පිරියත සහ උපකරණ

	පිරිවැය				
		වර්ෂය තුළ වෙනස්වීම්			
	2007 ජනවාරි 1 දිනට ශේෂය	වර්ෂය තුළ මිලට ගැනීම්	ප්‍රත්‍යාගණන	වර්ෂය තුළ ඉවත් කිරීම්	2007 දෙසැම්බර් 31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
ඉඩම් සහ ගොඩනැගිලි	1,900,000	–	2,466,000	–	4,366,000
පරිඝණක	12,014,740	11,266,601	–	–	23,281,341
කාර්යාල උපකරණ	4,712,473	1,516,051	–	–	6,228,524
ලී බඩු සහ සවිකිරීම්	17,491,034	10,009,588	–	–	27,500,622
රථ වාහන	12,494,118	3,911,122	–	(502,926)	15,902,314
කල්බදු වත්කම්					
මෝටර් රථ	6,993,828	3,365,217	–	–	10,359,045
	55,606,193	30,068,579	2,466,000	(502,926)	87,637,846

		ක්ෂයවීම්				
		2007 ජනවාරි 1 දිනට				2007 දෙසැම්බර් 31 දිනට
	අනුපාතය	සමුච්චිත ශේෂය	වර්ෂයට අදාළ ප්‍රමාණය	ප්‍රත්‍යාගණන	ඉවත් කිරීම	සමුච්චිත ශේෂය
	(%)	රු.	රු.	රු.	රු.	රු.
ඉඩම් සහ ගොඩනැගිලි	5	475,000	95,000	(570,000)	–	–
පරිඝණක	33 1/3	7,184,062	2,451,428	–	–	9,635,490
කාර්යාල උපකරණ	33 1/3	2,932,159	743,996	–	–	3,676,155
ලී බඩු සහ සවිකිරීම්	25	10,909,371	2,159,244	–	–	13,068,615
රථ වාහන	25	7,123,958	1,391,160	–	(212,726)	8,302,392
කල්බදු වත්කම්						
මෝටර් රථ	25	3,233,360	1,622,082	–	–	4,855,442
		31,857,910	8,462,910	(570,000)	(212,726)	39,538,094
ශුද්ධ අගය		23,748,283				48,099,752

	2007 රු.	2006 රු.
4. ලැබිය යුතු රක්ෂණ වාරික		
ණය ගැතියෝ	42,675,302	21,998,269
බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම	(5,878,836)	(4,399,339)
	36,796,466	17,598,930
5. වෙනත් වත්කම්		
තැන්පත්, අත්තිකාරම් සහ කලින් ගෙවීම්	21,659,124	9,776,274
ලැබිය යුතු රඳවා ගැනීමේ බද්ද	4,472,019	222,967
ආර්ථික සේවා බද්ද	5,843,111	3,073,450
ලැබිය යුතු පොලිය	10,507,639	11,748,906
මුක්තාවශේෂ තොග	364,200	–
අනෙකුත්	193,391	793,391
කාර්ය මණ්ඩල ණයගැතියන්	6,228,248	2,153,563
	49,267,732	27,768,551

	2007 රු.	2006 රු.
6. මුදල් හා මුදල්මය වත්කම්		
අත ඉතිරි මුදල්	238,569	163,059
බැංකුවේ ඇති මුදල්	28,261,623	27,784,866
මාර්ගස්ථ මුදල්	2,623,612	1,713,326
බැංකු අයිරාව	(22,087,053)	(3,751,650)
	9,036,751	25,909,601

7. රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත

ජීවිත රක්ෂණ අරමුදලෙහි අන්තර්ගත කර තිබෙන්නා වූ දිගුකාලීන ගිවිසුම්ගත බැඳීම් මූලික වශයෙන්ම උද්ගත වන්නේ සහභාගිවන හා සහභාගි නොවන නොයෙකුත් ජීවිත රක්ෂණාවරණ වලිනි. කෙටිකාලීන ගිවිසුම්ගත වගකීම් වන්නේ මූලික වශයෙන්ම අනතුරු හා සෞඛ්‍ය රක්ෂණ ආවරණයන් ය. රක්ෂණ ප්‍රතිපාදනය ගොඩනංවා ඇත්තේ පහත සඳහන් කරුණු මතය:

- රක්ෂණාවරණයට අදාල වර්ෂය හා ආවරණ අනුව වෙනස්වන පොලී අනුපාත,
- ප්‍රකාශිත ජීව දත්ත වගුවල දැක්වෙන භූගෝලීය කලාපයන් අනුව ලබා තිබෙන අත්දැකීම් අනුව ගලපා තිබෙන හා රක්ෂණාවරණයන්හි වෙනස්කම්වලට අදාල පරිදි සකස් කරනු ලැබූ ජීව දත්ත (මරණ අනුපාත),
- භූගෝලීය කලාප අනුව ලබා තිබෙන අත්දැකීම් හා රක්ෂණාවරණයන්හි වෙනස්කම් අනුව ගලපන ලද හිමිකම් ඉදිරිපත්කිරීමේ ප්‍රවනතාව.

රක්ෂණාවරණ හිමියන්ට වාර්ෂිකව ගෙවනු ලබන ලාභාංශය සමාගම මගින් තීරණය කරයි. ජීවිත රක්ෂණාවරණ හිමියන්ට රක්ෂණ ගිවිසුම අනුව හෝ රක්ෂණ රෙගුලාසි අනුව ශුද්ධ ලාභයෙන් වෙන්කළ යුතුව තිබෙන කොටස ද ලාභාංශයේ ඇතුලත් ය.

ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ 2007 දෙසැම්බර් 31 දිනට වූ රක්ෂණ ප්‍රතිපාදනය ඇක්චුවේරියල් හා මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්ගලික) සමාගම වෙනුවෙන් ජීවගණකඥ ආර්. කහකාච්චි මහතා විසින් අගය කිරීමකට ලක් කරන ලදී. උපදේශක ජීවගණකඥ තැනගේ වාර්තාවට අනුව රුපියල් 167,491,697 ක් වූ ප්‍රතිපාදිත මුදලෙහි රක්ෂණාවරණ හිමියන්ගේ ලාභාංශය සඳහා වූ වගකීම ද අන්තර්ගත ය. උපදේශක ජීවගණකඥ තැනගේ මතය අනුව දිගුකාලීන රක්ෂණ සඳහා වන වගකීම් ආවරණය කර ගැනීමට ද ප්‍රතිපාදනය ප්‍රමාණවත් ය. තවද මෙකී ප්‍රතිපාදනය තුළ රුපියල් 2,388,380 ක් වූ ශුද්ධ හිමිකම්පෑම ද ඇතුලත් ය.

8. සාමාන්‍ය රක්ෂණ ප්‍රතිපදාන

ශේෂ පත්‍රයේ දක්වා ඇති ජීවිත නොවන රක්ෂණ සංචිතයෙන් පහත සඳහන් දෑ නිරූපනය වේ:

	2007 රු.	2006 රු.
රක්ෂණ වාරික -		
නොඉපැයූ රක්ෂණ වාරික	135,752,068	90,077,812
පමාකළ අත්පත් කර ගැනීමේ පිරිවැය	(6,158,126)	(4,909,773)
දළ හිමිකම් සංචිතය		
ගෙවීමට ඇති හිමිකම්පෑම්	26,927,693	27,336,034
උද්ගතව තිබුණු නමුත් වාර්තා නොකළ හිමිකම්පෑම්	1,328,387	1,366,802
	157,850,022	113,870,875

හිමිකම් පෑම් දැනුම්දීමේ දී සෑහෙන තරම් ප්‍රමාදයන් සිදුවන බැවින් අත්දැකීම් හා විනිශ්චයන් යොදා ගනිමින් හොපියවූ වගකීම් ඇස්තමේන්තු කරනු ලැබූව ද ශේෂ පත්‍ර දිනයට පවතින්නා වූ එම වගකීම්වල අවසාන පිරිවැය නිසැක වශයෙන්ම දැනගත නොහැක්කේ ය.

සංචිත තීරණය කරනු ලබන්නේ දැනට පවතින්නා වූ තොරතුරු පදනම් කරගෙන ය. එසේ වුවද රක්ෂණ ව්‍යාපාරයන්ට ආවේණික ස්වභාවය අනුව පසුකාලීන උපනතින් සමග අවසාන වගකීම වෙනස්වීමට ඉඩ තිබේ.

9. විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම

9.1 විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති 16ට අනුව සියළුම සේවකයින් සඳහා ඔවුන්ගේ පළමු සේවා වසරෙහි සිට ගණන් බලන ලද විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීමක් සිදුකර තිබේ. කෙසේ වුවද 1983 අංක 16 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව සේවා යෝජකයාගේ වගකීම ඇතිවන්නේ නොකඩවා වසර පහක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුවය. මෙම වෙන්කිරීම සමාගමෙන් පිටත ආයෝජනය කර නැත.

	2007 රු.	2006 රු.
වර්ෂය ආරම්භයේ ශේෂය	3,315,132	2,377,589
වර්ෂය සඳහා වෙන්කිරීම	1,781,347	1,076,343
වර්ෂය තුළ ගෙවීම්	(268,562)	(138,800)
වර්ෂය අවසානයේ ශේෂය	4,827,917	3,315,132

9.2 සේවක අර්ථ සාධක හා භාරකාර අරමුදල් සඳහා කරන ලද දායකත්වය

සේවක අර්ථ සාධක අරමුදල	4,987,232	3,465,517
සේවක භාරකාර අරමුදල	1,250,005	946,136
	6,237,237	4,411,653

10. කල්බදු ගිවිසුම යටතේ දිගුකාලීන බැඳීම්

සමාගම මෝටර් රථ ගැනීම සඳහා මූල්‍ය කල්බදු ගිවිසුම් 8 කට එළඹී තිබේ. මුළු බැඳීම් පහත දැක්වෙන පරිදිය:

	2007 රු.	2006 රු.
කෙටිකාලීන වගකීම්		
දළ වගකීම්	2,330,822	1,931,393
බෙදා වෙන් නොකළ පොලිය	966,205	393,242
ශුද්ධ වගකීම	1,364,617	1,538,151
දිගුකාලීන වගකීම්		
දළ වගකීම්	4,201,303	1,818,739
බෙදා වෙන් නොකළ පොලිය	1,005,325	257,566
ශුද්ධ වගකීම්	3,195,978	1,561,173
මුළු වගකීම්	4,560,595	3,099,324
අනාගත අවම වාරික ගෙවීම් හා ශුද්ධ වාරික ගෙවීම්වල වර්තමාන අගය		
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කල්බදු ගෙවීම්		
2007	–	1,931,393
2008	2,330,822	1,057,954
2009	1,881,492	608,628
2010	1,425,021	152,157
2011	894,790	–
ශුද්ධ අවම වාරික ගෙවීම්	6,532,125	3,750,132
බෙදා වෙන් නොකළ පොලිය	1,971,530	650,808
ශුද්ධ අවම වාරිකවල වර්තමාන අගය	4,560,595	3,099,324

	2007 රු.	2006 රු.
11. වෙනත් වගකීම්		
ගෙවිය යුතු		
ඒජන්සි කොමිස්	2,594,909	5,621,385
රාජ්‍ය බදු	16,372,650	6,723,351
ලාභාංශ	3,683,208	9,957,458
ණය හිමියෝ		
ප්‍රතිරක්ෂණ	7,705,159	7,263,025
වියදම්	6,416,992	3,414,091
වෙනත්	100,943	100,943
තැන්පතු සහ අනෙකුත් අරමුදල්	5,675,214	3,362,193
	42,549,075	36,442,446
12. ප්‍රකාශිත ප්‍රාග්ධනය		
නිකුත් කළ සහ ගෙවා නිමි සාමාන්‍ය කොටස් ගණන	15,003,031	10,672,517
නිකුත් කළ සහ ගෙවා නිමි වරණීය කොටස් ගණන	1,532,250	–
	16,535,281	10,672,517
නිකුත් කළ සහ ගෙවා නිමි සාමාන්‍ය කොටස්	150,030,310	106,725,170
නිකුත් කළ සහ ගෙවා නිමි වරණීය කොටස්	15,322,500	–
අයදුම් හා විභජන ගිණුම	9,410	9,414
	165,362,220	106,734,584

සාමාන්‍ය කොටස් හිමියන් කලින් කලට ප්‍රකාශයට පත් කරනු ලබන ලාභාංශවලට හිමිකම් ලබයි. එමෙන්ම සමාගමේ රැස්වීම්වලදී එක කොටසකට එක ඡන්දය බැගින් වූ අයිතියකට ද හිමිකම් ලබයි.

වරණීය කොටස් හිමියන්ට ඔවුන් සතුව යම් ප්‍රමාණයක නිකුත් කරනු ලැබූ හා ගෙවා නිමකළ සාමාන්‍ය කොටස් ප්‍රමාණයක් තිබෙන්නේ ද එම ප්‍රමාණයට පමණක් සීමා වූ ඡන්ද අයිතියක් වරණීය කොටස් වෙනුවෙන් ද හිමිය.

2007 මැයි 03 දින සිට බලාත්මක කරන ලද 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව අනුමත ප්‍රාග්ධනය හා කොටසක සාමාන්‍ය මිල යන සංකල්පයක් තවදුරටත් අදාල වන්නේ නැත. එබැවින් පසුගිය වර්ෂයේ සංඛ්‍යා ඊට ගැලපෙන සේ ඉදිරිපත් කර තිබේ. නිකුත් කළ කොටස් වෙනුවෙන් සමාගමට ලැබුණ මුළු මුදල හෝ ගෙවීමට නියමිතව හා ගෙවිය යුතුව තිබෙන්නා වූ මුදල ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස දක්වා තිබේ.

	2007 රු.	2006 රු.
13. දළ ලේඛණගත රක්ෂණ වාරික		
ජීවිත රක්ෂණ	100,392,815	73,694,961
ජීවිත නොවන (පොදු) රක්ෂණ		
මෝටර්	191,326,262	113,905,933
ගිනි	30,563,239	23,474,589
මුහුදු	6,869,814	6,455,413
විවිධ	60,931,728	63,656,920
	390,083,858	281,187,816

	2007 රු.	2006 රු.
14. රක්ෂණ හිමිකම්පෑම හා ප්‍රතිලාභ		
ජීවිත නොවන (පොදු) රක්ෂණ		
දළ හිමිකම්පෑම -		
මෝටර්	87,637,804	60,414,656
ගිනි	9,193,113	2,569,276
මුහුදු	5,288,473	9,083,026
විවිධ	5,967,623	14,145,396
	108,087,013	86,212,354
මුක්තාවශේෂ විකුණුම් ආදායම	(2,517,154)	–
ප්‍රතිරක්ෂණ අයකර ගැනීම්	(6,126,256)	(11,369,817)
ජීවිත නොවන රක්ෂණ ශුද්ධ හිමිකම් පෑම්	99,443,603	74,842,537
ජීවිත රක්ෂණ -		
ශුද්ධ හිමිකම්පෑම් සහ ප්‍රතිලාභ		
දළ හිමිකම්පෑම් -		
මරණ, අබලතාව හා හිමිකම්පෑම්	5,910,577	3,182,012
ප්‍රතිරක්ෂණ අයකර ගැනීම්	–	–
ශුද්ධ හිමිකම්පෑම්	5,910,577	3,182,012
ඔප්පු කල්පිරීම	698,609	269,724
සිසු සෙත - ගෙවූ වාරික	19,994	25,625
විශ්‍රාම පාරිතෝෂික	382,409	64,042
	7,011,589	3,541,403
හිමිකම්පෑම් හා ප්‍රතිලාභවල මුළු එකතුව	106,455,192	78,383,940
15. ආයෝජනවලින් ලද ආදායම		
පොලී ආදායම (සටහන් අංක 15.1)	45,933,606	29,720,609
ලාභාංශ ආදායම	–	36,000
	45,933,606	29,756,609
15.1 පොලී ආදායම		
භාණ්ඩාගාර බැඳුම්කර	20,977,758	26,121,794
භාණ්ඩාගාර බිල්පත්	12,170,135	–
ස්ථාවර තැන්පතු	4,862,667	2,915,412
තීරු ගිණුම	–	466,880
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්	5,122,294	–
වාණිජ පත්‍රය	1,935,851	–
එක් දින තැන්පතු	864,901	216,523
	45,933,606	29,720,609

	2007 රු.	2006 රු.
16. වෙනත් ආදායම්		
රක්ෂනාවරන ණය පොලී	31,446	11,924
විදේශ විනිමය උච්චාවචනය	(2,940)	17,441
කාර්ය මණ්ඩල ණය පොලී	139,932	184,496
මෝටර් රථ විකිණීමේ ලාභය	212,727	61,782
විවිධ	428,502	629,209
	809,667	904,852
17. මෙහෙයුම්, ආයෝජන අනුබද්ධිත හා පරිපාලන වියදම්		
කාර්ය මණ්ඩලය (සටහන් අංක 17.1)	54,989,303	41,035,635
ආයතන හා පරිපාලන	50,563,497	32,852,560
විකිණීම	43,519,839	33,503,741
ක්ෂය	8,462,910	7,219,121
වෙනත් වියදම්	3,735,817	3,051,829
	161,271,366	117,662,886
17.1 කාර්ය මණ්ඩලය		
වැටුප් සහ වේතන	44,726,556	33,876,098
අනිවාර්ය සමාජ රක්ෂණ දායකවීම	6,237,236	4,411,652
දායක මුදල නිශ්චිතව දක්වා ඇති විශ්‍රාම සැලසුමට දායකවීම	1,781,347	1,076,344
කාර්ය මණ්ඩල සුභසාධනය	1,271,487	944,521
කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය	861,590	716,070
අනෙක් කාර්ය මණ්ඩල වියදම්	111,087	10,950
	54,989,303	41,035,635
18. මෙහෙයුම්වලින් ලද ලාභය		
මෙහෙයුම් ගණන් බලා ඇත්තේ පහත දැක්වෙන වියදම් අඩු කිරීමෙන් පසුව ය:		
අධ්‍යක්ෂක මණ්ඩල ප්‍රතිලාභ	1,037,960	886,645
අධ්‍යක්ෂක මණ්ඩල වෛද්‍ය රක්ෂණ	125,000	53,800
ක්ෂයවීම්	8,462,910	7,219,121
විගණන ගාස්තු	125,000	100,000
19. පොලී වියදම්		
මූල්‍ය කල්බදු ගිවිසුම්	655,523	738,317
	655,523	738,317

20. ආදායම් බද්ද

	2007 රු.	2006 රු.
වර්ෂය සඳහා වූ ආදායම් බදු වියදම		
වර්ෂය සඳහා වෙන්කිරීම	8,339,922	4,132,186
පෙර වර්ෂවල (අධි/ඌන) වෙන්කිරීම	–	186,550
	8,339,922	4,318,736
මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නැති පමාකළ බදු		
පමාකළ බදු වත්කම්	45,516,077	37,529,183
පමාකළ බදු වගකීම්	3,758,401	1,164,624

අලාභ පියවා ගැනීමට ගතවිය හැක්කා වූ දිගු කාලය ගැන අවධානය යොමුකර මෙතෙක් අඩුකර නොගත් අලාභ නිසා උද්ගතවන්නා වූ පමාකළ බදු වත්කම් මූල්‍ය ලේඛණවලට ඇතුලත් කර නොමැත.

21. කොටසක් ඉපැයීම

සාමාන්‍ය කොටස් හිමියන්ට අයිති ප්‍රමාණය වර්ෂයේ ශුද්ධ ලාභයෙන් වර්ෂය තුළ වලංගුව පැවති කොටස් සංඛ්‍යාවේ හරිත මධ්‍යයනයෙන් බෙදීමෙන් එක් කොටසක මූලික ඉපැයීම ගණන් බලා ඇත.

	2007	2006
වර්ෂයේ ශුද්ධ ලාභය (රු.)	22,855,568	8,283,647
වර්ෂය අවසානයේ සාමාන්‍ය කොටස් ගණන	12,837,774	10,672,517
කොටසක ඉපැයීම (රු.)	1.78	0.78

22. ගිවිසුම්ගත ගනුදෙනු හා ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනු සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

1. සමාගම සමුපකාර කල්බදු සමාගම සමග පහත දැක්වෙන ගනුදෙනුවට වර්ෂය තුළදී එළඹ ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වන එස්.ඒ. වික්‍රමපාල, පී.එම්.සී. බණ්ඩාර සහ කේ. ලියනගේ මහත්වරුන් සමුපකාර කල්බදු සමාගමේද අධ්‍යක්ෂවරු වෙති. සමාගමේ සභාපති, ඩබ්.එල්.ඒ. පීරිස් මහතා සමුපකාර කල්බදු සමාගමේද අධ්‍යක්ෂවරයෙකි.

2. සීමාසහිත සමුපකාර කල්බදු සමාගමේ කොටස් අරමුදලෙහි රු. 2,500,000/- ක් ආයෝජනය කිරීම.

3. සංස්ථාගත කොටස් හිමි ආයතනවල පහත දැක්වෙන අධ්‍යක්ෂවරු තනතුරු හොබවති.

අධ්‍යක්ෂවරයාගේ නම	තනතුර	කොටස් ගණන		සංස්ථාගත කොටස්හිමියාගේ නම
		සාමාන්‍ය	වරණීය	
ඩබ්.එල්.ඒ. පීරිස්	සභාපති	1,000,000	750,000	වෙන්නප්පුව විවිධ සේවා සමුපකාර සමිතිය
				ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය
පී.එම්.සී. බණ්ඩාර	සභාපති	66,814		මහියංගන විවිධ සේවා සමුපකාර සමිතිය
	සභාපති	621,500		සීමාසහිත ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය
	සභාපති	248		බදුල්ල දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලය
	උප සභාපති	11,080		ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
	උප සභාපති	12,430		ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය
එස්.ඒ. වික්‍රමපාල	සභාපති	549,500	500,000	වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය
කේ. ලියනගේ මහතා	සභාපති	533,750		කොළොන්නාව විවිධ සේවා සමුපකාර සමිතිය
	අධ්‍යක්ෂක	11,080		ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
බී. රණවක	සභාපති	11,080		ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
	සභාපති	119,980		කොටපොල විවිධ සේවා සමුපකාර සමිතිය
	සභාපති	750,000		මාතර දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය
ඒ.එස්. මිල්ටන්	සභාපති	554,000	67,500	බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය
ඩබ්.එච්. ජයසිරි	සභාපති	62,430		මහරගම විවිධ සේවා සමුපකාර සමිතිය
වී.එල්. වණිගසිංහ	සභාපති	1,108,000		මධ්‍යම පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය
ඒ. දහනායක	සභාපති	542,750		බෙලිඅත්ත විවිධ සේවා සමුපකාර සමිතිය
	සභාපති	540,500		හම්බන්තොට දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය

23. අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික කොටස් හිමිකම් පිළිබඳ විස්තර:

අධ්‍යක්ෂවරයාගේ නම	දෙසැම්බර්31 දිනට කොටස් ගණන	
	2007	2006
ඩබ්.එල්.ඒ. පීරිස් මහතා	3,032	1,600
පී.එම්.සී. බණ්ඩාර මහතා	5,757	3,461
ඩබ්.යූ. හේරත් මහතා	4,648	4,000
ලයනල් සමරසිංහ මහතා	3,227	2,601
වී.එල්. වණිගසිංහ මහතා	2,837	2,500
ඒ. දහනායක මහතා	2,837	2,500
කේ. ලියනගේ මහතා	1,243	1,000
බී.බී. පුන්‍යදාස මහතා	1,171	1,000
එස්.ඒ. වික්‍රමපාල මහතා	124	101
බී. රණවක මහතා	–	–
ඒ. එස්. මිල්ටන් මහතා	–	–
ඩබ්.එච්. ජයසිරි මහතා	–	–
ටී.එම්.එස්. නානායක්කාර මහතා	–	–

24. ප්‍රාග්ධන වියදම්

සමාගම විසින් අන්තර්ග්‍රාහී රක්ෂණ මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 16 ක ගිවිසුමකට ඉන්ෆොමැටික් ජාත්‍යන්තර සමාගම සමග එලඹී ඇත. මෙයින් රුපියල් මිලියන 5.16 ක් දැනට ගෙවා ඇත. ඉතිරි රුපියල් මිලියන 10.84 සම්පූර්ණවන පියවර අනුව ගෙවීමට ඇත.

25. නොනිමි නීති කෘත්‍ය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව සමාගමේ අනාගත ව්‍යාපාරික කටයුතුවලට හෝ මූල්‍යමය කටයුතුවලට අවහිර විය හැකි නිත්‍ය නීති කෘත්‍යයක් දැනට නැත.

26. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන්හි වෙනස්කම් ඇති කළ යුතු හෝ දැඩිසේ බලපාන කිසි සිදුවීමක් ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවී නැත.

27. අවිනිශ්චිත වගකීම්

ශේෂ පත්‍ර දිනයට අවිනිශ්චිත, වගකීම් කිසිවක් නොමැත.

28. සන්සන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ තොරතුරු දැක්වීමට අනුකූලව සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

අතිරේක තොරතුරු - දිගුකාලීන රක්ෂණය - ශේෂ පත්‍රය

සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම
වාර්ෂික වාර්තාව 2007

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2007 රු.	2006 රු.
වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	01	7,380,785	3,024,446
ආයෝජන	02	188,815,379	144,050,390
රක්ෂණාවරණ ණය		644,778	216,522
වෙනත් වත්කම්	03	12,802,041	5,460,327
වත්කම්වල එකතුව		209,642,983	152,751,685
වගකීම් සහ කොටස් හිමියන්ගේ අයිතිය			
වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම		412,242	245,375
රක්ෂණ ප්‍රතිපාදනය		165,103,317	127,435,345
හිමිකම් නොපෑ ප්‍රතිලාභ		2,388,380	864,037
කල්බදු ගිවිසුම		2,215,558	–
වෙනත් වගකීම්	04	10,215,278	10,317,528
බැංකු අයිරාව		1,272,208	192,320
		181,606,983	139,054,605
කොටස් හිමියන්ගේ අයිතිය			
කොටස් ප්‍රාග්ධනය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		25,000,000	13,697,080
ප්‍රත්‍යාගණන සංචිත		3,036,000	–
කොටස් හිමියන්ගේ මුළු අයිතිය		28,036,000	13,697,080
වගකීම් සහ කොටස් හිමියන්ගේ අයිතිය		209,642,983	152,751,685

දිගුකාලීන රක්ෂණයේ ශේෂ පත්‍රය, අතිරේක තොරතුරු සඳහා සටහන් පිටු 44 සිට 47 දක්වා සහ 25 සිට 40 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමග කියවිය යුතුයි.

සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම
වාර්ෂික වාර්තාව 2007

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2007 රු.	2006 රු.
දළ ලේඛණගත රක්ෂණ වාරික	100,392,815	73,694,961
අඩු කරන්න : ප්‍රතිරක්ෂකයින්ට කැප කළ වාරික	2,913,609	2,964,499
ශුද්ධ ලේඛණගත රක්ෂණ වාරික	97,479,206	70,730,462
ප්‍රතිලාභ, අලාභ සහ වියදම්		
රක්ෂණ හිමිකම්පෑම හා ප්‍රතිලාභ	7,011,589	3,541,403
ප්‍රාරක්ෂණ සහ රක්ෂණාවරණ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ද ඇතුළුව)	14,181,546	11,962,437
දිගුකාලීන රක්ෂණ අරමුදලේ වැඩිවීම - ජීවිත	37,667,973	35,221,375
ප්‍රතිලාභ, අලාභ සහ වියදම්වල එකතුව	58,861,108	50,725,215
ප්‍රාරක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිඵල	38,618,098	20,005,247
වෙනත් ආදායම්		
ආයෝජනවලින් ලද ආදායම්	22,561,667	11,736,992
වෙනත් ආදායම්	31,446	11,924
	22,593,113	11,748,916
වියදම්		
මෙහෙයුම්, ආයෝජන අනුබද්ධිත හා පරිපාලන වියදම්	59,514,479	31,754,163
පොලී වියදම	122,306	–
	59,636,785	31,754,163
වර්ෂයේ ශුද්ධ ලාභය	1,574,426	–

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2007 රු.	2006 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල		
ගණුදෙනුකරුවන්ගෙන් ලැබුණු රක්ෂණ වාරික	102,270,588	75,429,819
ගෙවූ ප්‍රතිරක්ෂණ වාරික	(3,166,208)	(2,161,603)
ලැබුණු කොමිස් අඩුකර ගෙවූ හිමිකම්පෑම්	(5,487,246)	(3,980,723)
ගෙවූ කොමිස්	(16,391,618)	(12,091,404)
සේවක මණ්ඩලයට හා ඔවුන් වෙනුවෙන් කළ ගෙවීම්	(21,621,987)	(10,905,376)
වෙනත් මෙහෙයුම් ගෙවීම්	(41,723,946)	(18,526,699)
ලැබුණු පොලිය	21,518,631	11,736,992
ලැබුණු වෙනත් ආදායම්	31,446	11,924
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල	35,429,660	39,512,930
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල		
ආයෝජන (ආයෝජන විකිණීමෙන් ලැබූ මුදල අඩුකළ පසු)	(44,764,988)	(62,035,074)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල	(44,764,988)	(62,035,074)
මූල්‍යමය ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල		
කොටස් නිකුත් කිරීමෙන් ලැබුණු මුදල්	8,583,814	22,471,803
මූල්‍ය කල්බදු සඳහා ගෙවූ මුදල	(328,374)	–
මූල්‍යමය ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල	8,255,440	22,471,803
මුදල් හා මුදල්මය වත්කම්වල වැඩිවීම	(1,079,888)	(50,341)
ජනවාරි 01 දිනට මුදල් හා මුදල්මය වත්කම්	(192,320)	(141,979)
දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල්මය වත්කම් (සටහන් - A)	(1,272,208)	(192,320)
සටහන් -A - දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල්මය වත්කම්		
බැංකු අයිරාව	(1,272,208)	(192,320)

දෙසැම්බර් 31 දිනට

1. දේපල, පිරියත සහ උපකරණ

	පිරිවැය				
	2007 ජනවාරි 01 දිනට ශේෂය	වර්ෂය තුළ වෙනස්වීම්			2007 දෙසැම්බර් 31 දිනට ශේෂය
		වර්ෂය තුළ මිලට ගැනීම්	ප්‍රත්‍යාගණන	වර්ෂය තුළ ඉවත් කිරීම්	
	රු.	රු.	රු.	රු.	රු.
ඉඩම් සහ ගොඩනැගිලි	1,900,000	–	2,466,000	–	4,366,000
පරිඝණක	1,274,972	–	–	–	1,274,972
කාර්යාල උපකරණ	1,373,317	–	–	–	1,373,317
ලී බඩු සහ සවිකිරීම්	5,340,433	–	–	–	5,340,433
රථ වාහන	1,125,000	–	–	–	1,125,000
කල්බදු වත්කම්					
මෝටර් රථ	853,565	2,500,000	–	–	3,353,565
	11,867,287	2,500,000	2,466,000	–	16,833,287

		ක්ෂයවීම්				
		2007 ජනවාරි 01 දිනට සමුච්චිත ශේෂය	වර්ෂයට අදාළ ප්‍රමාණය	ප්‍රත්‍යාගණන	ඉවත් කිරීම	2007 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ශේෂය
	අනුපාතය (%)	රු.	රු.	රු.	රු.	රු.
ඉඩම් සහ ගොඩනැගිලි	5	475,000	95,000	(570,000)	–	–
පරිඝණක	33 1/3	1,210,556	64,417	–	–	1,274,973
කාර්යාල උපකරණ	33 1/3	1,241,779	131,537	–	–	1,373,316
ලී බඩු සහ සවිකිරීම්	25	4,363,724	675,316	–	–	5,039,040
රථ වාහන	25	1,125,000	–	–	–	1,125,000
කල්බදු වත්කම්						
මෝටර් රථ	25	426,782	213,391	–	–	640,173
		8,842,841	1,179,661	(570,000)	–	9,452,502
ශුද්ධ පොත් අගය		3,024,446				7,380,785

2. ආයෝජන

	2007	2006
	රු.	රු.
භාණ්ඩාගාර සුරැකුම්පත්		
ලංකා බැංකුව	–	14,934,601
මහජන බැංකුව	20,085,292	71,365,129
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්	36,766,995	41,689,410
භාණ්ඩාගාර බිල්පත්		
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්	56,288,114	–
ෆස්ට් කැපිටල් සිලෝන් ලිමිටඩ්	23,905,354	–
ලංකා බැංකුව	21,768,895	–
ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම්	28,950,000	–
ස්ථාවර තැන්පතු		
මහජන බැංකුව	1,050,729	16,061,250
	188,815,379	144,050,390

	2007 රු.	2006 රු.
3. වෙනත් වත්කම්		
ලැබිය යුතු ගිණුම්		
ආයෝජන මත පොලිය	6,384,306	5,393,066
රක්ෂණ ණය මත පොලිය	69,054	17,258
තැන්පතු - භාණ්ඩාගාරය	50,000	50,000
ජංගම ගිණුම - ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය සමග	1,138,681	3
අත්තිකාරම්	5,160,000	–
	12,802,041	5,460,327
4. වෙනත් වගකීම්		
නොගෙවූ වියදම්		
ප්‍රතිරක්ෂණ - විදේශීය	3,158,500	3,411,099
කොමිස්	1,942,707	4,152,778
විකුණුම් ප්‍රවර්ධනය	–	31,650
දිරි දීමනා	–	49,065
ජීවිත රක්ෂණ වාරික	4,978,964	2,673,441
තැන්පතු	–	(505)
කල්බදු වාරික	78,374	–
පරිපාලන	56,733	–
	10,215,278	10,317,528

සමාගම් තොරතුරු

සමාගමේ නම
සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම

නීතිමය තත්ත්වය
1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ
1999 මාර්තු 02 දින ශ්‍රී ලංකාව තුළ
සංස්ථාගත කරන ලද සීමාසහිත මිල නොකළ
පොදු සමාගමකි

ලියාපදිංචි කාර්යාලය
3 වන මහල, 'කෝප්හවුස්'
455, ගාලු පාර
කොළඹ 03

සාමාන්‍ය රක්ෂණ අංශය
165, ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10

ජීවගණකයද උපදේශකවරු
ජීවිත රක්ෂණ
ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට්
කන්සල්ටන්ට් (පුද්) සමාගම
පළමු මහල - 434
ආර්.ඒ. ද මෙල් මාවත
කොළඹ 03

සාමාන්‍ය රක්ෂණ
තනවල කන්සල්ටන්සි සර්විසස්
ස්වාගටම් පළමු මහල
එස්.වී. පාර, කහා
බොම්බාය, ඉන්දියාව

විගණකවරු
පී.ඊ. මැතිව් සහ සමාගම
94 1/4, යෝර්ක් වීදිය
කොළඹ 01

බැංකුකරුවෝ
මහජන බැංකුව

ලේකම්වරු
බිස්නස් මැනේජ්මන්ට් සර්විසස් සමාගම
94 1/2, යෝර්ක් වීදිය
කොළඹ 01

අධ්‍යක්ෂ මණ්ඩලය
ඩබ්. ලලිත් ඒ. පීරිස් - *සභාපති*
පී.එම්.සී. බණ්ඩාර - *උප සභාපති*
ඩබ්. උපාලි හේරත් - *කළමනාකාර අධ්‍යක්ෂ*
එස්.ඒ. වික්‍රමපාල
බන්දු රණවක
බී. බී. පුන්‍යදාස
ලයනල් සමරසිංහ
ඒ.එස්. සරත් මිල්ටන්
ඩබ්.එච්. ජයසිරි
වී.එල්. වණිගසිංහ
ඒ. දහනායක
කේ. ලියනගේ
ටී.එම්.එස්. නානායක්කාර

සමාගමේ කළමනාකරණ මණ්ඩලය
පී. තලගල - *සාමාන්‍යාධිකාරී*
එම්. කරුණාරත්න - *සාමාන්‍යාධිකාරී (අලෙවි)*
ඒ. තෙබුවන - *මූල්‍ය කළමනාකරු*
එල්.සී.එස්. අල්විස් - *සහකාර සාමාන්‍යාධිකාරී (ජීවිත)*
ජේ.එස්. බණ්ඩාර - *මානව සම්පත් කළමනාකාරිණී*
සුචින්ත පෙරේරා - *පරිගණක කළමනාකරු*

Produced by: Smart Media Printed by: Printel (Pvt) Ltd.

සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම

"කෝප් හවුස් "
455, ගාලු පාර
කොළඹ 3
ශ්‍රී ලංකාව
දුරකථන:011-2556567-70, 011-5474000 ෆැක්ස්: 011-2556760
ඊමේල්: infor@coopinsu.com

වෙබ් අඩවිය: www.ci.lk